ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"පොළොවේ සීමාවල සිටින සියල්ලෙනි, මා වෙතට හැරී ගැලවියල්ලා. මක්නිසාද, මම දෙවියන් වහන්සේය. වෙන කෙනෙක් නැත." (යෙසායා 45 : 22)

81 වන වෙළුම අංක 05 (965) 2022 සැප්තැම්බර් / ඔක්තෝබර්

ස්වර්ගයෙන් එවන ලද පිඹිදීමට ජාතියක් මුදාගත හැකිය.

අල් විටින්හිල් විසිනි

"ස්වකීය දෙවියන්කොට ස්වාමීන් වහන්සේ ඇතුව සිටින ජාතියද, උන්වහන්සේ විසින් ස්වකීය උරුමයකොට තෝරාගත් සෙනඟද ආශීර්වාද ලද්දෝය." (ගීතාවලිය 33:12)

"ධර්මිෂ්ඨකම ජාතියක් උසස් කරයි. එහෙත් කවර සෙනඟකට වුවත් පාපය නින්දාවක්ය." (නීතෝපදේශ 14:34)

"මා විසින් අද නුඹට අණකරන නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ ආඥා ද, විනිශ්චයන්ද, පනත් ද නොපැවැත්වීමෙන් උන්වහන්සේ වෙනුවෙන් නැති නොකරන්ට බලාගනින්න." (ද්විතීය කථාව 8:11)

"දුෂ්ඨයෝ ඒසේය, දෙවියන් වහන්සේ සිහිනැති කරන සියළු ජාතීහු ෂෙයෝලොට හැරී යන්නාහුය." (ගීතාවලිය 9:17)

"දෙවියන් වහන්සේ සිහිනැති කරන්නෙනි, මා විසින් ඉරනු නොලබන පිණිසත් ගලවන්ට කෙනෙක් නැති නොවන පිණිසත් වෙය කල්පනා කරව්." (ගීතාවලිය 50:22)

අතීතයේ සිටියා වූ මහා අධිරාජ්‍යයන්ගේ නටඹුන් වලින් ඉතිහාසය පිරී තිබේ. ඒ සෑම එකක්ම ලෝකයේ සුක්කානම වෙත හැරී ඇවිත් තිබේ. ඔවුන් ඉතා ඉහළට නැගී එවැනි ප්‍රමුඛත්වයක් භුක්ති වින්දත් අද ඔවුන් මතකයක් පමණි. ඇමරිකාව සම්බන්ධයෙන් ද මෙය සත්‍යවේද..? බොහෝ ඉතිහාසඥයන් මානව සමාජයන් සඳහා පොදු විපත්තියේ හෝ මරණයේ ව්‍යාධිය වර්ගීකරණය කර ඇති රෝග නිශ්චය භයංකාරවේ. ඇත්තටම ජාතීන් මිය යන්නේ නැත. ඔවුන් ඇතුළතින් බාදනය වී ක්‍රමක්‍රමයෙන් දියවී යයි. තමන් තේරුම් නොගත් අයහපත් ක්‍රියාවන් සහ එහි සැගවී ඇති අන්තරායන් නිසා ඔවුන් තුළම විනාශය හට ගැනීමට හේතු වී ඇත. ඔවුන් දෙවියන් වහන්සේව සහ උන්වහන්සේගේ සත්‍යාතවය අමතක කර ඇත.

නීති බිඳවැටීම්, ආර්ථික බංකොලොත් බව, සාරධර්ම අහිමිවීම, ආත්මාර්ථකාමීත්වය සහ සමාජීය නියමන් බිඳවැටීම නිසා ජාතීන් පීඩාවට ලක්ව මරණයට පත්වෙමින් සිටිති. අවනීතිය ගලායාම වැළැක්වීම සඳහා නව නීති සම්පාදනය වී තිබුණත් සාමය ඇතිකර ගැනීමට සහ සාමය පවත්වාගෙන යාමට අසමත්වී සිටිති. එම නිසා අශිෂ්ඨත්වය පැමිණ අභ්‍යන්තරයේ ඇතිවන අඛණ්ඩ ව්‍යාකූලත්වයට එරෙහිවීමට ජාතියට නොහැකිවී ඇත. ජාතියට සදාචාරාත්මක ස්වභාවයන් අහිමිවී ඇති අතර පූජාවක්වීම තවදුරටත් මනුෂ්‍යයන් තුළ පවතින්නේ නැත. එම නිසා ජාතිය බෙදී අර්බුදවලින් පිරී පවතින්නෝය.

මේවා නොසැලකිලිමත්වන ජාතීන්ව ව්‍යසනය කරා ගෙන යන්නා වූ හොඳින් පැළඳී සිටින්නා වූ මාර්ග වන්නේය. මෙම රෝග ලක්ෂණ ඕනෑම ජාතියකට දැඩි අනතුරු ඇඟවීමක් විය යුතුය. ඒවා ඇත්තටම අවදිවී දෙවියන් වහන්සේ වෙතට හැරීමට සහ දෙවියන් වහන්සේව අමතක කර මරණයට යන මාර්ගයේ ක්‍රියාවන් දිගටම කිරීමෙන් වැලැක්වීමට සංඥා කිරීම වන්නේය. දෙවියන් වහන්සේව අමතක කරන ජාතියට අවස්ථාවක් නැත. එය මරණයෙන් කෙළවර වන රූප නමස්කාරය දක්වා දිව යයි. උන්වහන්සේට භය නැති , උන්වහන්සේව අමතක කළ ජාතියට උන්වහන්සේගේ අනතුරු ඇඟවීම් ඇසෙන්නේ කලාතුරකිනි. ඉතිහාසයේ සිදු වූ දේ නැවත නැවත සිදුවන්නේ බොහෝ දෙනා පළමු වතාවේදීම දෙවියන් වහන්සේට සවන් නොදීමයි. අතීතය නොමැතිව අනාගතය පැහැදිලිව දැකිය නොහැකිය කියා කෙනෙක් කියා තිබුණේය. ඇරිස්ටෝටල් පළමුවෙන් පැවසූ පරිදි අතීතයේ විනාශයන් නොදන්නා වූ අයට නැවත එය කිරීමට සිදුවන්නේය. ඉතිහාසයේ පාඩම් අපට ඉතිහාසයේ ස්වාමීන් වහන්සේ වෙතට ගෙන යාමට අදහස් කරන්නේය. එය ඇත්තටම උන්වහන්සේගේ කථාවක් වන අතර සෑම පුද්ගලයෙක්ම සහ සෑම ජාතියක්ම උන්වහන්සේට වගකිව යුතු බව ආදරයෙන් සහ ප්‍රායෝගිකව අපට හඬ නගයි. නැවත නැගිට්ටා වූ අපගේ ස්වාමීන් වහන්සේගේ පාමුල ඉතිහාසය අවසන් වනු ඇත. සෑම දණහිසක්ම උන්වහන්සේ ඉදිරියේ නැමෙන අතර සෑම දිවක්ම ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉදිරියේ නැමෙනු ඇත.

පිඹිදීමේ බලාපොරොත්තුව

දෙවියන් වහන්සේ ජාතියකට නැවත නැවතත් අනතුරු අගවන අතර උන්වහන්සේ එය ඉවත් කිරීමට පෙර එම ජාතියට බොහෝ ආකාරවලින් ආයාචනා කරනු ලබයි. හිතුවක්කාර ජාතියකට ඇති ශ්‍රේෂ්ඨ බලාපොරොත්තුව නම් දෙවියන් වහන්සේ දයානුකම්පාවෙන් යුතුව උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ බලවත් ක්‍රියාකිරීමක් එවා සෙනඟව උන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවයකට ගෙන ඒමයි. මනුෂ්‍යයන් දෙවියන් වහන්සේගේ එළිදරව් කිරීමට ප්‍රතිචාරය දැක්විය යුතු අතර දෙවියන් වහන්සේට, දෙවියන් වහන්සේ ලෙස ක්‍රියා කිරීමට ඉඩ ලබාදීමට පැමිණිය යුතුය. (හදවතින්ම දෙවියන් වහන්සේගේ වචනයට ප්‍රතිචාරය දැක්වූවා වූ නිවසේ සෙනඟට දක්වනු ලැබූ දෙවියන් වහන්සේගේ කරුණාව හොඳ උදාහරණයකි.) ඇමරිකාවේ සැබෑ පිඹිදීමක් ඇතිවන්නේ පිඹිදීම සඳහා වූ අපගේ මහත් වූ අවශ්‍යතාවය ගැන මනුෂ්‍යයන්ව දැනුවත් කිරීමෙන් පමණක් නොවේ. අපගේ වර්තමාන දරුණු පාප සහ වැරදි සියල්ල පෙන්වාදීමට අපි සමත් වුවද පිඹිදීමක් ඇති නොවේ. අපව ධෛර්යමත් කිරීමට සහ අපව ප්‍රබෝධමත් කිරීමට අවශ්‍ය විවිධාකාරයේ රැස්වීම් නිසා එය පැමිණෙන්නේ නැත. ඉක්මනින්ම පැමිණෙන විනිශ්චයට හසුවීමේ ලක්ෂණ ඉදිරිපත් කිරීමට සමත් වුවද පිඹිදීම පැමිණෙන්නේ නැත.

පිඹිදීම පැමිණෙන්නේ දෙවියන් වහන්සේගේ ස්ව කැමැත්තෙන් සහ දෙවියන් වහන්සේගේ සෙනඟ දෙවියන් වහන්සේ කවුද කියා උන්වහන්සේගේ එළිදරව්වීම කෙරෙහි ප්‍රකෘතිමත්ව ඇදහිල්ලෙන් ප්‍රතිචාරය දක්වන විට පමණි. සදාකාලිකත්වය අවබෝධ කර ගැනීමටත්, විශ්වාසනීය පිඹිදීමකින් ස්වර්ගය විවෘත කර ගැනීමටත් හැකි වන්නේ ඇදහිලිවන්තයන්ගේ එක්සත් යාච්ඤා කිරීමකට පමණි. ඇදහිල්ලේ යාච්ඤාව සඳහා දෙවියන් වහන්සේගේ ස්වර්ගීය දර්ශනය නැවත ලබාගන්නා ස්ථානයට දෙවියන් වහන්සේගේ සෙනඟව ගෙන එන්නේ කුමක්ද .. ? දෙවියන් වහන්සේගේ වචනය තුළින් උන්වහන්සේගේම නැවුම් එළිදරව්වීමක් අපට අවශ්‍යව තිබේ. ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව ඔසවමින් උන්වහන්සේගේ සියලු අලංකාරයන් සහ බලයන් අනාවරණය කරගත යුතුය. මෙම අනාවරණය තුළ දෙවියන් වහන්සේගේ සෙනඟ කෙබඳු ආකාරයේ අය විය යුතුද කියා මහිමාන්විත ලෙස අනාවරණය වීම ආවේණිකව තිබේ. එවිට දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේට ප්‍රතිචාරය දැක්වීමට තෝරාගත යුත්තේ සභාව තුළ පවතින නොගැලපීම් සහ පරස්පරතා ඉවත් කිරීමට උන්වහන්සේට ඉඩ සැලසෙන ආකාරයටය. දෙවියන් වහන්සේ හැර අපට වෙන බලාපොරොත්තුවක් නැත. සභාව උන්වහන්සේට යටත් වූ විට නැවත වාරයක් ලුණු සහ ආලෝකය බවට පත්වනු ඇත. උන්වහන්සේ තමන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේව කරුණාවෙන් යුතුව සභාව වෙත වගුරුවනු ලබන සේක. ආත්මයෙන් පූර්ණ වූ දේව සභාවක් ඇමරිකාවේ ලොකුම අවශ්‍යතාවයයි. සභාව උන්වහන්සේගේ නැවත නැගිටීමේ ජීවිතය සහ බලයේ මාධ්‍යයක් බවට පත්වේ.

2 පිටුවට

1 පිටවෙන්

ස්වර්ගයෙන් එවන ලද පිඹීමට...

ස්වාමීන් වහන්සේව සෙවීමට කාලය පැමිණ තිබේ.

මිත්‍රවරුණි, අපේ කාලයේ සභාව තුළ උන්වහන්සේ කවුරුන්ද යන්න පිළිබඳව පෙනීම විශාල ලෙස අහිමි වී ගොස් තිබීම ගැන වාද කරන්නේ කවුද ... ? තවද උන්වහන්සේගේ ශුද්ධකම අප නොදකින නිසා හෝ නොදන්නා නිසා දේව භය නොමැත. මක්නිසාද අපගේ අපවිත්‍රකම් අපට නොපෙනෙන නිසා කුඩා හැරීමක්වත්, පසුතැවිලිවීමක්වත් නොමැත. උන්වහන්සේගේ සමාවදීම සහ කරුණාව නොදකින නිසා ඒ ගැන ප්‍රීතියක් නොමැත. උන්වහන්සේගේ සැලසුම් සහ සදාකාල අරමුණු අපට නොපෙනෙන නිසා අරමුණක් හා අර්ථයක් නොමැතිකම අපට දැනෙන්නේය. අවසානයේ දී අප නිම නොවන හිඟ දේවල මත රැඳී සිටින්නෙමු.

ඇමරිකාව බරපතල අනතුරක සිටින බවත්, බොහෝ කලක සිට ජාතීන්ගේ වැරදි නැවත, නැවත කරමින් සිටින බවත් අපි දනිමු. ඇත්ත වශයෙන්ම අපි ඔවුන්ගේ වැරැද්ද තුළ ඔවුන් අභිබවා වරද කරන්නෙමු. අපි දෙවියන් වහන්සේගේ බොහෝ ආශිර්වාද සහ සත්‍යතාවය භුක්තිවිඳීම පමණක්ම අපට උන්වහන්සේට ගණන් දිය යුතු බවට පත්කර ඇත. නිසැකවම අපි දෙවියන් වහන්සේගේ කරුණාව තුළ සහ අතීතයේ දී ලැබුවා වූ උන්වහන්සේගේ බලය තුළ ඇති ආශිර්වාද මත ජීවත්වන්නෙමු. අපි උන්වහන්සේගේ ආශිර්වාදය සුළුකොට තිබෙන බව ඔබ පිළිගන්නේ නැද්ද... ? සැබෑ ලෙස නැවුම් පසුතැවිලිවීමකින්, ඇදහිල්ලෙන් සහ යටහත්කමින් උන්වහන්සේ ඉදිරියේ ැවටීමට කාලය මෙය නොවේද ..? එකට එක්ව නැතිවුණා වූ ස්වාමීන් වහන්සේගේ ශුද්ධකමේ බලාපොරොත්තුව සෙවීමට කාලය මෙයයි. ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය වන සභාව ඇගේ මුහුණ ක්‍රිස්තුස් වහන්සේගේ මුහුණ සෙවීමට යොමු කිරීම අපගේ සෑම සභාවකම අවශ්‍යතාවයයි.

පිඹීදීම පැමිණෙන විට එය සභාවට ආශිර්වාදයක් පමණක් නොව එය ලෝකය උදෙසා නිවැරදීම ඉලක්කය වන්නේය. දෙවියන් වහන්සේගේ තේජසින් පිරුණා වූ සභාවකට සාතන් භය නිසා සතුරු ලෝකයක සතුරුකම සභාවට විරුද්ධව යොමුවනු ඇත. දෙවියන් වහන්සේගේ පිඹීදීම ලැබූ මනුෂ්‍යයන්ට ලෝකයෙන් සහ සභාව තුළ සිටින ලෞකිකයන්ගේ එදිරිවාදිකම් සහ පහරදීම් පැමිණේ. නමුත් දෙවියන් වහන්සේ සභාවේ හිමිකරුවාණන් නිසා සභාව තුලින් උන්වහන්සේගේ බලය ප්‍රකාශ කරනු ලබන සේක. ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීමේ බලය නැවම් ලෙස උන්වහන්සේගේ ශරීරය වන සභාව තුළ ප්‍රකාශ නේනට සලස්වන සේක. සභාව උන්වහන්සේගේ ශුද්ධකමේ අලංකාරයෙන් උන්වහන්සේට නමස්කාර කරනු ලබන්නේය. (ගීතාවලිය 96:9) එමෙන්ම සුභාරංචියේ බලය තේජසින් යුක්තව ඉදිරියට ගමන් කරන්නෝය සභාව තුළ අනර්ඝ වූ ස්වාමීන් වහන්සේගේ මාර්ගය ඇත්නම් එය කෙබඳු වේදැයි සිතා බලන්න. දෙවියන් වහන්සේගේ මහිමය එයින් පිටාර ගලනු ඇත. මෙය ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව නැවත ශුද්ධ ලියවිල්ලට අවනතවීමට කාලයයි. අපි ගණුදෙනු කළ යුත්තේ හදවතේ ඇති සැබෑ ප්‍රශ්නය සමගයි. දෙවියන් වහන්සේ සමඟ ඇති ස්වර්ගීය සමීපතාවයෙන් අපව වළක්වා ඇති සහ උන්වහන්සේගේ මහිමය උදෙසා ඇති ආශාව යටපත් කර ඇති කාරණා පිළිබඳව දැඩි ලෙස ක්‍රියා කළ යුතුය.

බලයෙන් සැරසෙන්න පිරී ඉතිරී යන ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වය සමඟ නැවත නැගිටීමේ ජීවිතයේ ප්‍රීතිය සහ බලයෙන් සැරසී සිටීම ඇති නව ගිවිසුමේ සභාව දැකීමට ලෝකය බලා සිටිති. වෙන කිසිම දෙයක් ලෝකය පුදුම කරවන්නේවත්, යේසුස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ බව සහ දේව වචනයේ පවසන අනර්ඝ වූ ස්වාමීන් වහන්සේ උන්වහන්සේ බව ඒත්තු ගන්නේවත් නැත. අපට සබාව තුළ පිඹීදීම තිබිය යුතුය. අපගේ ජාතියට සහ ලෝකයට ඇති එකම බලාපොරොත්තුව එයයි. එබැවින් අප සෑම කෙනෙකුගේම ප්‍රශ්නය නම් මේ පැයේ දී දේවයන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ උන්වහන්සේගේ සභාවලට පවසන දෙයට සුදුසු ලෙස ප්‍රතිචාරය දැක්වීමට අප කරන්නේ කුමක්ද යන්නයි. අපි එක්සිත්ව, නිහතමානීව, මංමුලාවීම ගැන පසුතැවැලිවෙමින් උද්යෝගිමත්ව දේව වචනය මත පදනම් වී ආත්මයෙන් යුතුව යාච්ඤාවෙන් උනන්දුකමෙන් උන්වහන්සේව සොයමුද ?

සභාවේ හදවත තුළට ස්වාමීන් වහන්සේගෙන් පණිවිඩයක් ලැබෙන තෙක් සභාවට ලෝකයට ලබාදීමට පණිවිඩයක් නොමැති බව සත්‍යය නොවේද ... ? ස්වාමීන් වහන්සේ විසින් සභාව ඇවිලවිය යුතුය. නැති නම් ලෝකය විසින් සභාව නොසලකා හරිනු ඇත. දෙවියන් වහ්නසේ ඇවිලෙන්නා වූ සභාවට ප්‍රේම කරන සේක. ඇල්මැරුණා වූ සභාවක් තුළ උන්වහ්නසේට වාසය කිරීමට නොහැකිය. මෙය දෙවියන් වහන්සේව සෙවීමට කාලයයි. දෙවියන් වහන්සේගේ පොරොන්දු මත අපව දල්වාලීමට ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩදීමට කාලයයි. ස්වර්ගවෙන් පැමිණෙන්නා වූ පිඹීදීමට ජාතික මුදාගත හැකිය. අප ජීවයත්ව මංමුලාවීම සහිත පැයට සුදුසු සහ නිවැරදි යාච්ඤාවකින් උන්වහන්සේ වෙතට හැරෙමු. උන්වහන්සේ තුළ මහිමාන්විත බලාපොරොත්තුවක් ඇත.

"ස්වාමීන් වහන්ස .... පිඹීදීමක් එවුව මැනව... එය මා තුළ පටන් ගැනීමට මට ඉඩ සලසා දුන මැනව."

ආත්මික ජීවිතය සහ බලය උතුරා පිටාර ගැලීම.

"පෙර‍වඟ දූතයා මෙම කාලයේදී පිඹීදීම උදෙසා යාච්ඤාවේ බලය සහ අවශ්‍යතාවය කෙරෙහි ඉලක්ක කර‍ගෙන අවධානය යොමු කර‍න්නෙමු. අපි මෙම පණිවිඩය පිළියෙල කර‍මින් සිටියදීත් මෙම පණිවිඩවලින් ඔබට ධෛර්යය ලැබීම කර‍ුණු කොටගෙන අභියෝගයත්, උද්යෝගයත් ඇතිවනු ඇතැයි බලාපොරොත්තු වුනෙමි.

මෙම පණිවිඩ තුළ ඇති වැදන් වූ සිහිගැන්වීම් වලින් එක් දෙයක් නම් අප වටා ඇති ලෝකය තුළ වෙනසක් ඇති කිරීමට අපි වඩාත් සන්නද්ධව සිටින පිණිස උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේගෙන් සහජීවනයෙන් අපව පුර‍වාලීමට උන්වහන්සේ කැමැත්තෙන් සිටින බවයි. අපගේ ජීවිත වලින් අනිත් අයගේ ජීවිතවලට ආශිර්වාදය ගලායන පිණිස උන්වහ්නසේ අපට ආශිර්වාද කර‍න සේක. දෙවියන් වහන්සේ ආරම්භවිට පැවසුවේ ඒ ආකාර‍යෙන් වන සේක. "මම නුඹ මහත් ජාතියක් කර‍න්නෙමි. නුඹට ආශිර්වාදකොට නුඹේ නාමය කීර්තිමත් කර‍න්නෙමි. නුඹට ආශිර්වාදයක් වෙයන්න. තවද නුඹට ආශිර්වාද කර‍න්නන්ට මම ආශිර්වාද කර‍න්නෙමි. නුඹට ශාප කර‍න්නන්ට මම ශාප කර‍න්නෙමි. පොළොවේ සියලු පවුල් නුඹ කර‍ුණුකොටගෙන ආශිර්වාද ලබන්නෝ යයි කී සේක." (උත්පත්ති 12:1-2) යේසුස් වහන්සේ ද ඒ ආකාර‍යෙන්ම උන්වහන්සේගේ ගෝලයන්ට පැවසූ සේක. "නුමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ නුඹලා කෙරෙහි පැවිණී කළ නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙර‍ුසලමෙහිද, මුළු යුදයෙහි ද , සමාරියෙහි ද, පොළොවේ සීමාව දක්වා ද මාගේ සාක්ෂිකාර‍යෝ වන්නහුයැයි කී සේක. "(ක්‍රියා 1:8)

රිවි කාමයිකල් විසිනි.

ලුණු සහ ආලෝකය

අපි පොළොවේ ලුණු සහ ලෝකයේ ආලෝකය බව යේසුස් වහන්සේ පැවසූ සේක. (මතෙව් 5:13-16) බලාපොරොත්තු බිඳ වැටී තිබෙන ලෝකයට එවැනි ලුණු සහ ආලෝකය අවශ්‍යව තිබෙන බවට සැකයක් නැත. එබැවින් සභාවේ අවශ්‍යතාවය දෙවියන් වහ්නසේගේ ප්‍රේමයෙන් , ජීවිතයෙන්, බලයෙන්, ශුද්ධාත්මයෙන් පිරී සිටීමයි. පළමු ලිපියේ දී එල් විටින්හීල් පැවසුව පරිදි ඇමරිකාවේ සභාව තුළ ඇති මහත් වූ අවශ්‍යතාවය ශුද්ධාත්මයෙන් පූර්ණවීම බව ප්‍රකාශ කර ඇත. සැබවින්ම අනිත් සෑම රටකටමත් මෙය සත්‍යව තිබේ. සහෝදර විටින්හීල් තවදුරටත් පවසන්නේ අලුත් ගිවිසුමේ සභාව ඉහළින් පැමිණෙන බලයෙන් සැරසී උතුරා යන නැවත නැගිටීමේ ප්‍රීතිය ඇතිව ස්වාමීන් වහන්සෙගේ අභිමුඛත්වයේ සිටිනු දැකීමට ලෝකය බලා සිටින බවත්, වෙන කිසිම දෙයකින් ලෝකය විශ්මයට පත්කිරීමට හෝ දේව වචනයේ පවසන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අනර්ඝ වූ ස්වාමීන් වහන්සෙ බව ඒත්තු ගන්නේවත් නැති බවයි. අප සභාව තුළ පිඹීදීම තිබිය යුතුය.

බලය පරාවර්තනය කිරීම

තෙසලෝනිකයේදී පාවුල්, සීලස්, තිමෝති කළ සේවයේ දී මෙය මතකයට එන්නේය. ඔවුන් මුලින්ම තෙසලෝනිකයට පැමිණෙද්දී

3 පිටුවට

2 පිටවෙන්

ආත්මික ජීවිතය සහ බලය...

නගරයේ සෙනඟ රූප නවස්කාරය තුළ මුල් බැසගෙන සිටියේය. එහෙත් කෙටි කාලයක් තුළ ඔවුන් වෙනස් වූයේය. **"එසේ නුඹලා වෙතට අපේ පැවිණීම කොයි ආකාරව තිබුණේ ද කියාත් නුඹලා ජීවමානවූ, සැබෑවූ දෙවියන් වහන්සේට වෙහෙකරන පිණිසද, උන්වහන්සේ විසින් මළවුන්ගෙන් නැඟූවුන ලද්දාවූ, පැවිණෙන උදහසින් අප ගලවන්නා වූ තමන්ගේ පුත්‍රවූ යේසුස් වහන්සේ ස්වර්ගයෙන් එනවා බලා සිටින පිණිසද නුඹලා දේවතාරූප කෙරෙන් දෙවියන් වහන්සේ වෙතට හැරුණු හැටිත් ඔවුහුව දන්වති."** (1 තෙසලෝනි 1:9-10) මෙම ආත්මික පෙරළිය ඇතිවීමට හේතුවූයේ කුමක්ද කියා පාවුල්තුමා මෙසේ කියා තිබේ. **"මක්නිසාද අපේ සුබාරංචිය නුඹලා වෙතට පැවුණුනේ වචනයෙන් පමණක් නොව බලවත්, ශුද්ධාත්මයෙන්, බොහෝ නිසැකකමත් ඇතුවය. එසේය නුඹලා නිසා අපි කොයි ආකාර අය වීවුදැයි නුඹලා දන්නහුය."** (1 තෙසලෝනික 1:5) තවත් ආකාරයකින් පවසනවා නම් තෙසලෝනිකවරුන් දෙවියන් වහන්සේගේ වචනයට, දෙවියන් වහන්සේගේ බලයට , දෙවියන් වහන්සේගේ ආත්මාණන් වහන්සේ වෙතට, ආත්මයෙන් පූර්ණ වූ දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයන් වෙතට (පාවුල්, සීලස්, තිමෝතියස් වැනි) සමීප වූවෝය. මෙම සමීපවීමේ බලපෑම කොයිතරම් තියුණුව තිබුණා ද කියා පවසනවා නම් ඔවුන්ගේ විපත්තිවලින් දෙවියන් වහන්සේ වෙතට හැරුණා පමණක් නොව තවත් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ ජීවිත සාක්ෂියක් විය. **"වෙසේ නුඹලා මකිදෝනියෙහි සහ අකායෙහි සිටින සියලු අදහිල්ලිවන්තයන්ට ආදර්ශවුනහුය. මක්නිසාද නුඹලා වෙතින් ස්වාමීන් වහන්සේගේ වචනයේ හඬ මකිදෝනියෙහිත් අකායෙහිත් පැතිර ගියා පමණක් නොව අප විසින් කිසිවක් කියන්නට ඕනෑ නොකරන හැටියට දෙවියන් වහන්සේ කෙරෙහි තිබෙන නුඹලාගේ අදහිල්ල සෑම තැනම ප්‍රකාශ විය. "** (1 තෙසලෝනික 1:7-8)

අපේ කාලයේ සභාව පිඹිදම අත්දකිමින් ඉහළින් පැමිණෙන්නාවූ බයෙන් සැරසී සිට නැවත නැගිටීමේ ජීවිතයේ ප්‍රීතියෙන් හා ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වයෙන් පිර සිටින්නේ නම් කුමක් සිදුවේවිද ..? ස්වාමීන් වහන්සේගේ ප්‍රේමයෙන් අපි පිරී ගියොත් කුමක් සිදුවේවිද .. ? පාවුල් සහ ඔහුගේ සමාගම්කාරයන් මෙන් සුභාරංචිය පතල කිරීමට පමණක් නොව, නැති වූ අය උදෙසා ජීවිතය බෙදා ගැනීමටත් ආශාවෙන් සිටියේය. (1 තෙසලෝනික 2:7) එවැනි ප්‍රේමයකින් අපගේ ජීවිත පිරී ගියොත් කුමක් සිදුවේවිද .. ? දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ අභිමුඛත්වය, බලය සහ ප්‍රේමය ගැන උද්යෝගිමත් වන විට සමාජයේ සහ ජාතියේ සෙනගගේ ජීවිතවල ඇතිකරන බලපෑම කොයිතරම් ගැඹුරද කියා ඉතිහාසයේ සිදුවූ පිඹිදීම් වලින් අපි දනිමු. වෙස්ලි ඩිවෙල් විසින් "පිඹිදීම උදෙසා මොරගසන හදවත" යන පාඩමෙන් බෙදා ගන්නා පරිදි පිඹිදීම පැමිණෙන විට ඇදහිලිවන්තයන් උදහෝගිමත්වී ක්‍රිස්තුස් වහන්සේ මෙන් වීමට යොමුවෙනවා පමණක් නොව සුභාරංචියට බොහෝ විරුද්ධකම් පැවාවූ මනුෂ්‍යයන් පවා ගැලවීම උදෙසා දෙවියන් වහන්සේගේ රුණාව වෙට ඔවුන්ගේ හදවත් විවෘත කරනු ඇත. කලින් වසර ගණනාවක් තිස්සේ සිදු නොවූ දේ පිඹිදීම කෙටි කාලයකින් කරනු ලබන අතර දෙවියන් වහන්සේගේ කාර්යය වේගවත් කරනු ලබන්නේය. වෙනත් ආකාරයකින් කියනවා නම්, දෙවියන් වහන්සේගේ අස්වාභාවික ප්‍රබෝධමත්වීම අත්දකිනවිට අස්වාභාවික ප්‍රතිඵල අපි දකින්නෙමු.

පාපය සමඟ ගණුදෙනු කරමින් ස්වාමීන් වහන්සේව සොයන්න.

මෙම කාරණය අඩංගු වූ මිෂනාරීවරුන් දෙදෙනෙකුගේ සාක්ෂි දෙකක් සමඟ පාඩමක් කියාදීමට අපට භාග්‍යය ලැබුණේය. ඔවුන් සුභාරංචියේ කාරණාවල යෙදී සිටියත් ආත්මික ඵල ස්වල්පයක්වත් ලබා නොතිබුණ ද අනිත් ඇදිහිලිවන්තයන් සමඟ පිඹිදීම අත්දුටුවිට සිය ගණන් ආත්ම ගැලවීම වෙතට හැරුණේය. ඊට හැරවීමේ ලක්ෂය වූයේ මිෂනාරිවරුන් ඔවුන්ගේ පුරන්බිම කොටා ගැනීමට ආරම්භ කිරීමයි. "ධර්මිෂ්ඨකම පිණිස වපුරාගෙන කරුණාවේ හැටියට කපාගනිල්ලා. පුරන්බිම කොටාගනිල්ලා. ස්වාමීන් වහන්සේ ඇවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු, දැන් උන්වහන්සේ සොයන්ට කාලයයි. "(හොෂෙයා 10:12) මිෂනාරිවරුන් දෙදෙනා ඔවුන්ගේ ජීවිතවල සෑම පාපයක්ම හොඳින් පිළිගනිමින් පාපොච්චාරණය කර පසුතැවිලි වෙමින් ඔවුන්ගේ පුරන්බිම කොටාගත්තේය. ඔවුන් දෙවියන් වහන්සේගේ බලය සහ උන්වහන්සේගේ අභිමඛුත්වය සොයමින් ස්වාමීන් වහන්සේ තුළ යාච්ඤා කිරීමට ඔවුන්ගේ හදවත් වැගිරවීමටත් පටන්ගත්තේය. දෙවියන් වහන්සේගේ ජීවනය සහ ප්‍රේමය ඔවුන් තුලට වැගිරවීමටත් ඔවුන් තුළින් අනිත් අයගේ ජීවිතවලට බලපෑමක් ඇති කිරීමටත් දෙවියන් වහන්සේ කරුණාවන්තව සහ විශ්වාසවන්තව සිටි සේක.

ඔවුන් මෙන් තවත් බොහෝ දෙනාද පිඹිදීම අත්දුටුවෝය. ස්වාමීන් වහන්සේගේ ප්‍රේමය, බලය, අභිමුඛත්වය සහ උන්වහන්සේගේ ආත්මයාණන් අත්දැකීමට නම් අපි අපගේ පාපය ගැන ගැඹුරින් ගණුදෙනු කරමින් ස්වාමීන් වහන්සේව සෙවිය යුතුය. අපි එසේ කරන විට අපගේ ජීවිත පුබුදුවාලීමට සහ අපගේ ජීවිතවලින් අනිත් අයට බලපෑමක් ඇති කිරීමටත් ස්වාමීන් වහන්සේ විශ්වාසවන්තව සිටින සේක. මෙම අනර්ඝ වූ පොරොන්දු දෙස සැලකිල්ලෙන් යුතුව බලන්න.

"මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත්වී යාච්ඤා කර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව්කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි. " (2 ලේකම් :14)

"මා විසින් නුඹලා ගැන කරන යෝජනා මවම දනිමි. නුඹලාට වතුකාලයේ දී බලාපොරොත්තුවක්දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමීන් වහන්සේ කියන සේක. නුඹලා මට අඬගසන්නහුය. ගොස් මට යාච්ඤා කරන්නහුය. මම ද නුඹලාට ඇහුම්කන් දෙන්නෙමි. නුඹලා මා සොයනවා ඇත. නුඩලාගේ මුළුසිතින් මා සොයන කළ මා නුඹලාට සම්බවෙනවා ඇත." (යෙරමියා 29:11-13)

"එහෙත් එතැන සිට නුඹලා නුඹේ දෙවිවූ ස්වාමීන් වහ්නසේ සොයමින් නුඹේ මුළු සිතෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද සොයන්නහු නම් උන්වහන්සේ නුඹට සම්බවෙන සේක. නුඹ පීඩාවිඳින කළ ද වේ සියලු දේ නුඹට පැමිණීකළ ද අන්තිම දවස්වලදී නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේ දෙසට හැරී උන්වහන්සේගේ හඬට ඇහුම්කන් දුන්නහොත්, නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේ දයාවන්ත දෙවි කෙනෙක් බැවින් උන්වහන්සේ නුඹ අත්නාරිනසේක. නුඹ විනාශ නොකරන සේක. උන්වහන්සේ නුඹේ පියවරුන් සමඟ දිවුලාවූ ගිවිසුම මතක නැති නොකරන සේක." (ද්විතිය කථාව 4:29-31)

අපි පාපයෙන් සම්පූර්ණයෙන්ම ඈත්වී ස්වාමීන් වහන්සේ වෙතට හැරී එන ලෙස දෙවියන් වහන්සේගේ අභිමුඛත්වයෙන් සහ උන්වහන්සේගේ බලයෙන් අපව පූර්ණකර අනිත් අයගේ ජීවිතවලට තියුණු බලපෑමක් ඇති කිරීමට එය ගලායාමට සලස්වන සේක. සියලු මහිමය උන්වහන්සේට වේවා ....!

"ඔබගේ සෙනඟ ඔබ කෙරෙහි ප්‍රීතිවක් වන පිණිස අප නැවත ජීවත් නොකරන සේක්ද .. ? ස්වාමීනී.., ඔබගේ කරුණාව අපට දැක්වුව මැනව. ඔබගේ ගැලවීම අපට දුන මැනව. දෙවි වූ ස්වාමීන් වහන්සේ කුමක් කියන සේක්දැයි අසන්නෙමි. මක්නිසාද උන්වහන්සේ ස්වකීය සෙනඟටත් ශුද්ධවන්තයන්ටත් සමාදානය වදාරණ සේක. නමුත් ඔවුහු අඥානවකට නැවත නොහැරෙත්වා. තේජස අපේ දේශයේ වසන පිණිස සැබවින්ම උන්වහන්සේගේ ගැලවීම උන්වහන්සේට භය වෙන්නන් සමීපයෙහිය." (ගීතාවලිය 85:6-9)

පිඹිදීම උදෙසා මොරගසන හදවත.

(වෙස්ලි එල් විසිනි.) (1916-2016)

යේසුස් වහන්සේ නැවත පැමිණීමට පෙර අවම වශයෙන් එක් මහා පිඹිදීමක්වත් ඇතිවේවිද .... ? එසේ වනු ඇතැයි මම බොහෝ සේ අනුමාන කරමි. එයට එක් හේතුවක් නම් පසුගිය වසර ගණනාවක් තිස්සේ බොහෝ රටවල දේව සේවයේ යෙදීමට දෙවියන් වහන්සේ මට වරප්‍රසාදය ලබා දුන් අතර මම කොතැනකට ගියත් දෙවියන් වහන්සේ තෝරාගත් දරුවන් පිඹිදීම් උදෙසා පිපාසිතව සිටින බව මම දුටුවෙමි. මම එය සෑම තැනකින්ම සොයා ගත්තෙමි. උන්වහන්සේගේ සභාව පිඹිදෙනු දැකීමටත් එම බලවත් පිඹිදීම පැමිණෙන විට සිදුවනු ඇති සියල්ල දැකීමටත් අපි ආශා කරන විට අපගේ ස්වාමීන් වහන්සේ ඉදිරියේ කඳුළු සැලීමට අපට රැගෙන එන්නේ මෙම ශුද්ධ වූ පාපිසායේ කතෘවරයා වන ශුද්ධාත්මයාණන් වහන්සේ බව මම විශ්වාස කරමි. නිතරම පිඹිදීමේ වාතාවරණයෙන් පෙගුණ විට අපගේ පවුල්වල මිතුරන් අතරේ සහ දේවස්ථානයේ යාච්ඤාවට මැලිව සිටියා වූ අය දෙවියන් වහ්නසේගේ කරුණාවට යටත් වන්නෝය. එමෙන්ම යේසුස් වහන්සේගේ උවමනාව තිබෙන්නේ පළුද්දක් හෝ කැළලක් නැත. ශුද්ධ වූ අලංකාර මනමාලියක් බව මම දනිමි. පිඹිදීම ක්‍රිස්තුස් වහන්සේ මනමාලිය උදෙසා මහත් පුදුම දේ කරන්නේය. එය අපව වඩා වැඩියෙන් යේසුස් වහන්සේ මෙන් කරනු ලබන්නේය.

සභාව පිඹිදීම පිය වූ දෙවියන් වහන්සේගේ පුත්‍ර වූ දෙවියන් වහන්සේ සහ ශුද්ධාත්ම වූ දෙවියන් වහන්සේගේ හදවතේ ඇති ලොකුම ආශාව බව මම විශ්වාස කරමි. අපගේ හදවත්වල ඇති පිපාසය දෙවියන් වහන්සේගේ හදවතේ ඇති ගැඹුරු පිපාසයෙහි සුළු පිළිබිඹුවක් බව මම විශ්වාස කරමි. දෙවියන් වහන්සේ පිඹිදීම උදෙසා අපගේ හදවත්වල ආශාව නිර්මාණය කර තිබෙනවා පමණක් නොව දෙවියන් වහ්නසේ පිඹිදීම එවන බවද ඉතිහාසය සාක්ෂි දරයි. පිඹිදීම උදෙසා අනාගතවකතෘගේ හදවතේ තිබූ මොර ගැසීම ගැන යෙසායා 64:1-2 පදවල මෙලෙෂ සඳහන් කර ඇත.

"අහෝ .... ඔබගේ එදිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිනිසද ඔබ ඉදිරියෙහි ජාතීන් වෙවුලවන පිණිසද ඔබ

4 පිටුවට

3 පිටවෙන්

පිඹීදීම උදෙසා මොරගැසෙන...

වහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැළැව දල්වන්නාක් මෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් මෙන්ද ඔබ ඉදිරියෙන් කඳු දියවයන්නටත් යොදුණොත් හොඳය." (යොසායා 64:1-2)

මනුෂ්‍යය පුත්‍රයා උපදිනතෙක් ඊශ්‍රායෙල්ට ඔරොත්තුදී සිටීමට හැකිවූයේ ඉඳහිට පිඹීදීම ඇති වූ කාලයන් නිසාය. සාතන් ඊශ්‍රායෙල් ජාතියට පහර දුන් අතර මෙසියස් වහන්සේගේ පැමිණීමේ දී සම්පූර්ණවන ශුද්ධ ලියවිල්ලේ සඳහන් දේ වැළැක්වීමට ඔහුට හැකි සෑම දෙයක්ම කරනු ලැබුවේය. යෙහෝෂාපාට් සහ සොෂියා යටතේ පිඹීදීම ඇති විය. ආහස් රජු වෙත පැමිණි විට එය ප්‍රමාද වී ඇති බව පෙනුණේය. සියල්ල පහවී ගොස් ඇති බවක් පෙනේනට තිබුණි. ආහස් රජතුමා ජෙහෝවා දෙවියන් වහන්සේට කළ නමස්කාරය මැඩ පවත්වා තිබුණේය. ඔහු සෑම විදීයකම කෙළවරේ සහ සෑම නගරයකම රූප නමස්කාරය ඇති කළ බව පයිබලයේ පවසන අතර අවසානයේදී පූජාසනයේ ගින්න නිවා දමා දේව මාළිගාව වසා දැමීමට නියෝග කළේය. රූප නමස්කාරය රට පුරා පැතිරී ගියේය.

එහෙම වුනත් කෙටි කාලයකින් පැහැදිලි හැරීමක් සිදු විය. නපුරු (දුෂ්ඨ) ආහස් රජු මිය ගිය පසු ඊළඟ දවසේ හෙසකියා බලයට පත් වූ විට දේව මාළිගාවේ දොරවල් ඇරීමටත් ලෙවීවරුන්ට දේව මාළිගාව පවිත්‍ර කිරීමටත් අණ කළේය. සති දෙකක් තිස්සේ ඔවුන් අතුගා පිරිසිදු කර කුණු කසල පිටතට ගෙන ගියෝය. ලෙවීවරු පැමිණ දේව මාළිගාව සම්පූර්ණයෙන්ම පවිත්‍ර කළ බව හෙසකියා රජතුමාට වාර්තා කළේය. ඊළඟ දවසේ නමස්කාර කිරීමට ආරම්භ කරන ලෙස රජතුමා නියෝග කළේය. රටේ ප්‍රධානීන්ව සිටි පුරවැසියන් දේව මාළිගාවට පැමිණි අරත ස්වාමීන් වහන්සේට නමස්කාර කිරම ආරම්භ විය. ස්වාමීන් වනහන්සේගේ ගීතිකාව නැවත ගායනා කිරීමට පටන්ගත්තෝය. ස්වාමීන් වහන්සේගේ පූජාසනය මත ගිනි දල්වන ලදී. ජාතිය ආපසු හරවනු ලැබුවාය.

දෙවියන් වහන්සේගේ පිඹීදීමේ දෙවියන් වහන්සේ වන අතර දෙවියන් වහන්සේ පිඹීදීම එවූ බව ඉතිහාසය සාක්ෂි දරයි. දෙවියන් වහන්සේ ජෝන් වෙස්ලිව සහ ජෝන් වයිට්ෆීල්ඩ්ව නැගිටුවන අවස්ථාවේ දී බ්‍රිතාන්‍යයේ තත්ත්වය මතක තබාගන්න. අගමැතිවරයා දුරාචරය එළිපිටම උඩඟු ලෙස විදහාපාමින් සිටියේය. වංශවත් අයගේ සහ රාජකීයයන්ගේ විශේෂ අවස්ථාවලදී "ඔබගේ අසල්වැසියොගේ බිරිඳ සමඟ සතුටුවෙමින් ඔබට උවමනා සියලුම වයින් පානය කරන්න" කියා ප්‍රසිද්ධ කළේය. කළ පාපය සහිතව සෙනඟ කොයිතරම් දූෂිත වී තිබුණේද ..? ලන්ඩන්, මැනිචෙස්ටර් සහ බර්මින්හැම් නගර වලින් පිටත තනිව සිටීම අනාරක්ෂිත විය. ගම්බද ප්‍රදේශවල සැරිසරන ආයුධ සන්නද්ධ රස්තියාදු කාර කණ්ඩායම් සිටින නිසා මනුෂ්‍යයන් සන්නද්ධ තූර්යවාදක කණ්ඩායම් සමඟ ගමන් කළෝය. නමුත් පිඹීදීම ප්‍රමාද නොවීය. එංගලන්තයට පිඹීදීමක් ඇතිවූයේ දෙවියන් වහන්සේට වෙස්ලි, වයිට්ෆීල්ඩ් සහ දෙවියන් වහන්සේගේ ජනතාව සිටි බැවිනි. දෙවියන් වහන්සේ එයට කිසිදාක ප්‍රමාද වන්නේ නැත.

පිඹීදීම ගෙන එන්නන්

දෙවියන් වහන්සේ පිඹීදීමේ පුද්ගලයන් බවට පත් වූ මනුෂ්‍යයන්ව නැගිටවා ඇත. එසේ නැති නම්, මම පිඹීදීම ගෙන එන කෙනේ යැයි මට පැවසිය හැකි විය යුතුය. මනුෂ්‍යයෙකුට පිඹීදීම ගෙන ආ හැකිද .. ? තමන්ගේම ශක්තියෙන් ඔහුට එය කළ නොහැකිය. නමුත් ඒ උදෙසා වාහකයක් ලෙස ඔහුව පාවිච්චි කළ හැකිය.

චාර්ල්ස් ජී. ෆිනී පිඹීදීමේ වාහකයෙක් ලෙස පෙනෙන්නට තිබුණි. අවුරුද්දෙන් අවුරුද්ද තැනින් තැනට තමාට දෙවියන් වහන්සේ මඟ පෙන්වූ බව හැගෙන ස්ථානවලට ඔහු ගියේය. ඔහු මාස දෙක තුනක් හෝ පිඹීදීමක් එනතුරු එහි රැඳී සිටියේය. ඔහු ගැලවීම ලැබූ අවස්ථාවේ සිට ඔහු දෙවියන් වහන්සේ වෙනුවෙන් ඇවිලෙමින් සිටි බව පෙනෙන්නට තිබුණි. ඔහු ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම ඔහු මතට ලබාගගත්තායින් පසුව ඒ ගින්දර ඔහු සමඟ රැගෙන ගියේය. ඔහු ගිය ගිය තැනට නැවත නැවත පිඹීදීම පැමිණියේය.

ජොනතන් ගෝපෝර්ක් උතුරු චීනයේ සේවය කළ විශ්වාසවන්ත මිෂනාරීවරයෙකි. යම් කෙනෙක් චාර්ල්ස් ෆිනී ලියන ලද පත්‍රිකාවක පිටු කිහිපයක් ලිපියක් මගින් ඔහුට එවනු ලැබීය. එය කියවූ පසු ඔහු තම භාර්යාවට පැවසුවේ "ෆිනී හරි නම් මම එය ඔප්පු කරන්නෙමි." කියාය. කවුරු හරි චාර්ල්ස් ෆිනීගේ ජීවිතය ගැන ලියූ පිටපතක් ඔහුට එවනු ලැබීය. ඔහු තව තවත් උද්යෝගිමත් විය.

ඒ කාලයේදී ටොරොන්ටෝහී කැනේඩියානු ප්‍රෙස්බිටේරියන් සභාවේ විදේශ ධර්මදූත සේවයේ ලේකම්වරයා උතුරු චීනයට පැමිණ සති කිහිපයක් එහි ගත කළේය. ඔහු ගෝෆෝත් මහතාට පැවසුවේ මට කොරියාවේ පිඹීදීම ගැන වාර්තා අසන්නට ලැබේ. එය සත්‍යද, නැද්ද කියා සොයා බැලීමට මම එහි යන්නෙමි. ඔබත් මා සමඟ එහි යාමට කැමතිද කියාය. ගෝපෝර්ත් සිතින් සූදානම්ව සිටි නිසා ඔහු සමඟ ගොස් දෙවියන් වහන්සේ කරන දේ දුටුවෝය. ජොනතන් ගෝපෝර්ත් නැවත චීනයට පැමිණියේය. ඔහු ආපසු පැමිණ රාත්‍රියෝ කොරියාවෙන් සොයාගත් දේ පිළිබඳ සිදුවීම පවසන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටි අතර චීනයේ පිඹීදීම ආරම්භ විය. ගෝපෝර්ත් දුම්රිය නැවතුම් පොළෙන්, නැවතුම් පොළට සහ තැනින් තැනට ගියේය. ඔහු නතරවෙන සෑම තැනකටම එම පිඹීදීම පැමිණියේය.

දෙවියන් වහන්සේගේ ස්වභාවය පිඹීදීමයි.

දෙවියන් වහන්සේ පිඹීදීම එවනවා පමණක් නොව නැවත ප්‍රාණවත් කිරීම දෙවියන් වහන්සේගේ ස්වභාවයයි. දෙවියන් වහන්සේ අනුකම්පාවේ දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේ ප්‍රේමයේ දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේව යම් කෙනෙක් මතට වැගිරීමට උවමනාව ඇතිව සිටින දෙවියන් වහන්සේය. අපගේ දවස් තුළ ප්‍රබෝධමත් කාලයක් ලෙස යැවීමට දෙවියන් වහන්සේ කැමැත්තෙන් සහ හැකියාවෙන් සිටින බව විශ්වාස කිරීමට බයිබලයානුකූල සෑම හේතු සාධකයක්ම තිබේ. පිඹීදීම සඳහා පිපාසය සහ යාච්ඤාව පුළුල් වන බව ඉතිහාසයෙන් පෙනේනට තිබේ. ඒ ආකාරයෙන්ම අද දවසේදීත් කිරීමට දෙවියන් වහන්සේට හැකිව තිබෙන සේක. නිසැකවම තමන් වහන්සේගේ මනාලිය පවිත්‍ර නොකැලැල් සහ උන්වහන්සේගේ තේජසින් බැබලීම සඳහා යේසුස් වහන්සේගේ හදවතේ ඇති ශුද්ධ වූ ආශාවන්ට නැවත, නැවතත් පිළිතුරු ලබාදිය හැකිය. දෙවියන් වහන්සේගේ දරුවන් වන අප සමඟබෙදා ගන්නා වූ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ශුද්ධ වූ ආශාවන්ට නිසැකවම පිළිතුරු ලබාදිය හැකිව සිටින සේක. අපි දෙවියන් වහන්සේට සමීපව ගමන් කරන්නේ නම් පිඹීදීම උදෙසා යාච්ඤාවේ බර දරාගන්නේ නම්, සමහර විට වචනයෙන් කිව නොහැකි තරම් ගැඹුරු දෙවියන් වහන්සේගේ ආශාවන් මොනවාදැයි අපට වැටහෙන්නට පටන් ගන්නේය. යේසුස් වහන්සේගේ ගෝලයන්ගේ ඇදහිල්ලේ මදිකම ගැන යේසුස් වහන්සේ අවස්ථා කිහිපයකදී වේදනාවට පත්වූවාදැයි ඔබට මතකද ... ? ස්වාමීන් වහන්සේගේ අභිමුඛත්වයෙන් පැමිණෙන්නා වූ බලවත් ප්‍රබෝධමත් කිරීමේ අවස්ථාවන්, පැමිණෙන්නා වූ අළුත්කිරීම්, අපගේ ඇදහිල්ලේ දුර්වලකම් නිසා වළක්වාලමින් බාධාකර තිබේ. උන්වහන්සේගේ පොරොන්දු අප වෙනුවෙන් බව විශ්වාස කිරීමට අපට කෙසේ හෝ හැකිවේවා.... ! ඒවා (පොරොන්දු) වර්තමානයටයි. මෙය තවමත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාලයයි. මෙය තවමත් පිඹීදීම, උද්යෝගිමත් කිරීම, නැවත අළුත්කිරීම පවතින කාලයයි. මේවා අතරින් ඔබට පාවිච්චි කිරීමට අවශ්‍ය වන්නේ කුමන වචනයක් වුවත් මෙය තවමත් මනුෂ්‍යය ඉතිහාසයේ එම කාල පරිච්ඡේදයයි. දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ සබාවට අලුත් ආකාරයකින් උන්වහන්සේව අනාවරණය කිරීමට, ආශිර්වාද කිරීමට උන්වහන්සේගේ ආත්මය අළුත් ආකාරයකින් වැගිරවීමට අවශ්‍යව තිබෙන සේක.

පිඹීදීම යනු දෙවියන් වහන්සේගේ හදවතේ මොරගැසීමයි.

පිඹීදීම සඳහා වූ හදවතේ මොරගැසීම දෙවියන් වහන්සේගේ හදවත තුළ ඉපදී ඇති බව මම මුළුසිතින්ම විශ්වාස කරමි. දෙවියන් වහන්සේ කරුණාව දැක්වමට බොහෝ සෙයින් ආශා කරන බව මම විශ්වාස කරමි. උන්වහන්සේගේ දයානුකම්පාවෙන් යුතුව තිබෙන හදවත සමීපයෙහි බව මම විශ්වාස කරමි. කෙසේ හෝ සභාව තවමත් අවසන් නොකළ බොහෝ කාර්යයන් පවතින බව මම විශ්වාස කරමි. සැබවින්ම ක්‍රිස්තුස් වහන්සේට ඉක්මනින් ක්‍රියා කළ හැකිව තිබෙන සේක. පිඹීදීම සති කිහපයක් පවතින්නේ නම් වසර එකහමාරක් හෝ ඊට පෙර වසර හතලිහකින් නොකළ දේ සිදු කරයි.

උන්වහන්සේගේ පිඹීදීම පැමිණෙන විට කාර්යයන් වේගවත් වන්නේ කෙසේද ..? 1858-1859 කාලයේ දී ඇමරිකාවේ පිඹීදීමේ දී යෙරමියා ලැම්පියර්ගිණි පුපුරක් දැල්වූ විට දෙවියන් වහන්සේ සභාව තුළ ගැවසෙන්නාක් මෙන් පෙනුණේය. යෙරමියා ලැම්පියර් නිව්යෝක් නගරයේ යාච්ඤා රැස්වීමක් ආරම්භ කළ අතර මාස කිහිපයකින් නගරය පුරා යාච්ඤා රැස්වීම් පැවැත්වුණි. ඉන්පසු ඔවුන් ඇමරිකාව පුරාම පැතිරෙන්නට විය. වොෂින්ටන් නගරයේ දහවල් කෑම පැයේ දී පවත්වනු ලැබූ යාච්ඤා රැස්වීමට ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා දවසක් පාසා දවසක් සහභාගි වූයේය. මාස කිහිපයකින් එය ඇමරිකාව පුරා නගර දස දහසකට වැඩි ගණණකට පැතිරී ගියේය. වයාපාරිකයන් සෑම දවසකම මධ්‍යහන පැයේ දී තම ව්‍යාපාර වසා දමා ඔවුන්ට එක්රැස්විය හැකි තරම් විශාල ස්ථානවල එක්රැස්වී යාච්ඤා කළෝය. බොහෝ විට සමහර ව්‍යාපාරික ස්ථානවල ප්‍රධාන දොරටුවේ "යාච්ඤා රැස්වීම අවසන් වන තුරු වසා ඇත." යනුවෙන් දැන්වීමක් ප්‍රදර්ශනය කරනු ලැබුවෝය. කවුරුන් හෝ දේශනා කළාද...? කිසිවෙක් දේශනා කළේ නැත. ඔවුන් දේශනා කිරීමට කාලය වැය කළේ නැත. ඔවුන් යාච්ඤා කිරීමට කාලය වැය කළෝය. එක්රැස් වූ අය ගීතිකාවක් ගායනා කළොත් ඊට පසුව මනුෂ්‍යයන් නැගිට සිට යාච්ඤාවන් ඉල්ලනු ඇත. එමෙන්ම එක ඉල්ලීමකට පසුව තව ඉල්ලීමකට ඔවුන් යාච්ඤා කළෝය. ඔවුන් පස්වරු එකට නැවත ඔවුන්ගේ ව්‍යාපාරවලට ගියෝය. එය ශුද්ධාත්මයාණන් වහන්සේගේ අසාමාන්‍ය ක්‍රියා කිරීමකි. විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ නැගෙනහිර ප්‍රදේශ පුරා යාච්ඤාවේ වියනක් සහ යාච්ඤාවේ සුවඳක් පැතිරී ගියෝය.

දෙවියන් වහන්සේගේ සිත අපට දැකගත හැකි නම්, උන්වහන්සේ තම සෙනඟ වෙතට පැමිණීමට ආශාවෙන් සිටින ආකාරය සහ

5 පිටුවට

4 පිටවෙන්

පිඹීදීම උදෙසා මොරගසන...

උන්වහන්සේ ආශිර්වාද කිරීමට බලා සිටින ආකාරය අපට පෙනෙනු ඇත. දෙවියන් වහන්සේට අවශ්‍ය වන්නේ අපගෙ දේවස්ථානවල මණ්ඩල වෙතට කොමිෂන් සභා වෙතට සම්මන්ත්‍රණවලට සහ අප සතු සියලුදේවල් වෙතට පැමිණීමයි. උන්වහන්සේට ආධිපත්‍ය පැවැත්වීමට අවශ්‍යව තිබෙන සේක.

යෙසායා යාච්ඤා කළාක් මෙන් එම පිඹීදීම පැමිණෙනු ඇත. දෙවියන් වහ්නසේ පහළ වනු ඇත. ස්වාමීන් වහන්සේට පිඹීදීමේ බලය තුල බැස එන ලෙස අපි දන්නා තරමින් ප්‍රථමයෙන්ම යාච්ඤා කළ තැනැත්තා දාවිත් වන්නේය. "ස්වාමීනී.... , ඔබගේ අහස නමාගෙන බැස්ස මැනව. කඳු ස්පර්ශ කළ මැනව, එවිට එයින් දුම් නගින්නේය." (ගීතාවලිය 144:5) ඵවාමීන් වහන්සේ අපගෙ ජීවිත මත පහළ වේවා...! අපි සාමාන්‍යය කිතුණු ජීවිතයක් ගැන සෑහීමකට පත් නොවන්නෙමු. දෙවියන් වහන්ස .., ඔබගේ මහිමයේ බලයෙන් අප වෙතට, ඔබගේ සභාව වෙතට වැඩිය මැනව. යෙසාමහිමයේ බලයෙන් අප වෙතට, ඔබගේ සභාව වෙතට වැඩිය මැනව, යෙසායා අනාගතවකතෘ යාච්ඤා කළේ කෙසේදැයි ඔබට මතකද .. ?

"අහෝ...., ඔබගේ එදිරිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද ඔබ ඉදිරියෙහි ජාතීන් වෙවුලවන පිණිසද ඔබවහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැළෑව දල්වන්නක් වෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් වෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියව යන්නටත් යෙදුණොත් හොඳය. අප බලා නොසිටිය භයානක දේ කරමින් ඔබ බැස්ස සේක. ඔබ ඉදිරියේ කඳු දියව ගියේය. තමන් ගැන බලා සිටින අය උදෙසා ක්‍රියා කරන්නා වූ ඔබ හැර වෙන දෙවි කෙනෙක් ඇති බවක් පුරාණයේ සිට අසන්ට යෙදුනේවත් කණට වැටුනේවත්, ඇසින් දකින්ට යෙදුනේවත් නැත. ප්‍රීතිවී ධර්මිෂ්ඨකම් කරන්නා වූ, ඔබගේ මාර්ගවලදී ඔබ සිහිකරන්නා වූ අයට ඔබ සම්බවන සේක. වෙන්න. ඔබ කෝපවූ සේක. අපි පව් කළෙමුව. බොහෝකලක සිට අපි ඒවායේ පැවතුණෙමුව. අපට ගැලවීම ලැබේද .. ?" (යෙසායා 64 :1-5)

දෙවියන් වහන්සේට නැවත කිරීමට අවශ්‍යව තිබෙන්නේ එයයි. ඒ උදෙසා අපට කරන්නට පුළුවන් දෙයක් නොමැත. එය දෙවියන් වහන්සේ දෙන්නා වූ දෙයකි. අපට එය ලබා දෙන්නා වූ දෙවියන් වහන්සේ අප සමඟ සිටින සේක. අපට සිටින්නේ කරුණාවන්ත දෙවියන් වහන්සේ වන සේක. පිඹීදීමට ප්‍රේම කරන දෙවියන් වහන්සේ අපට සිටින සේක. තමන් වහන්සේගේ සභාවට ප්‍රේම කරන දෙවියන් වහන්සේ අපට සිටින සේක. උන්වහන්සේගේ සභාව තවමත් සූදානම් නැති බව දන්නා වූ දෙවියන් වහන්සේ අපට සිටින සේක. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පවිත්‍ර කිරීමේ, පිරිසිදු කිරීමේ උද්යෝගිමත් කිරීමේ කාර්යය අප වෙත එවන සේක.

ඔබ දිනපතා පිඹීදීම උදෙසා මැදහත්කාරයෙක් වන්නේ ද ... ? දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ කරුණාවන්තකම තහවුරු කිරීමට බලා සිටින බව මම විශ්වාස කරමි. දෙවියන් වහන්ස, අප සියලුදෙනාගේ හදවත්වල අපගේ සියලුම දේවස්ථානවල අපගේ ජාතිය සහ ලෝකය පුරා දැල්වීමට පිඹීදීමේ ගින්නක් එවන සේක්වා .. !

කඩුල්ලේ සිටීමට කැඳවන සේක

කිතුණු සභාව අස්වභාවික, බලයෙන් තොර සභාවක්වීම දෙවියන් වහන්සේ අපේක්ෂා නොකළ සේක. සභාව පිහිටුවීමේදී ක්‍රිස්තුස් වහන්සේගේ සැලැස්ම වූයේ අය මේ අඳුරු ලෝකයට ආලෝකය ලබාදිය යුතු බවයි. ලෝකය මරණීය සටන් වැදීමක් සඳහා සැලකිය යුතු සූදානම් කිරමක් ඇතිව සිටිති. ඒ අතරම කිතුණු සභාව ඉතිහාසයේ විශාලතම අර්බුදයට මුහුණ දෙමින් සිටිති. පාපයේ මිය යන ලෝකයේ බර තමන් මතට ගෙන කඩුල්ලේ සිට මැදහත්කාරකම් කිරීමට දෙවියන් වහන්සේ මැදහත්කරුවන්ව කැඳවන සේක.

"අහෝ ....., ඔබගේ එදිකාරයන්ට ඔබගේ නාමය දන්වන පිණිසද, ඔබ ඉදිරියෙහි ජාතීන් වෙවුලන පිණිසද ඔබවහන්සේ අහස පලාගෙන බසින්ටත්, ගින්න කැළෑව දල්වන්නාක් වෙන්ද, ගින්න වතුර උතුරවන්නාක් වෙන්ද, ඔබ ඉදිරියෙන් කඳු දියවයන්නටත් යෙදුණොත් හොඳය." (යෙසායා 64:1-2)

මනුෂ්‍යය වර්ගයා වෙනුවෙන් මේ පැයේ දී අවශ්‍යතාවය ඇති ශ්‍රේෂ්ඨතම සේවය කරන පිණිස කැඳවනු ලැබුවා වූ මැදහත්කරුවන් යාච්ඤාවෙන් බලා සිටීමට කාලය වැය කළ යුතුය. දේව රාජ්‍යයේ නියමයන් සමඟ යාච්ඤාවෙන් මැදහත්කාරකම් කිරීම සේවයේ විශාලතම කාර්යයයි. අපි අඩුවෙන් යාච්ඤා කිරීම පසුතැවිලිවිය යුතු කාරණයකි. අපගේ ඉහළම වරප්‍රසාදය යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ සමඟ සහභාගිකම් පැවැත්වීමයි. බොහෝ කාරණාවලදී බලය නැතිව සිටීම කොපමණ අසාමාන්‍යව තිබෙන දෙයක්ද .. ? සියොන් පවුර මත සිටින්නා වූ මුරකරුවන් **"එබිබා යෙරුසලම නුඹේ පවුරු පිට මුරකාරයන් සිටෙවුවෙමි. ඔවුහු රෑවත්, දවල්වත් කොහෙත්ම නිශ්ශබ්ද නොවන්නෝය. ස්වාමීන් වහන්සේට මතක් කරවන තැනැත්තෙනි, උන්වහ්නසේ යෙරුසලම පිහිටුවා පොළොවෙහි ඒක ප්‍රශංසාවක් කරන තුරු නුඹලා නිශ්කලංක නොග නිල්ලා. උන්වහන්සේට නිශ්කලංක නොදෙල්ලා." (යොසායා 62:6-7)**පරීක්ෂාව (සෝදිසි කිරීම) ජයග්‍රහණයට හරවා ගනිමු

එස්තර් රැජිණ සහ මොර්දෙකයි අනතුර වළක්වා ගැනීමට නිරාහාරව සිට යාච්ඤා කළ පරිදි අපි නිරාහාරව සිට යාච්ඤා කළ යුතුය. **"තවද කෙරුණු සියල්ල මොර්දෙකයි දැනගත් විට ඔහු තමාගේ වස්ත්‍ර ඉරා අලු ඇතුව ගෝනි රෙදි හැඳගෙන, නුවර මැදට ගොස් මහත් වූ දුක්ඛිතවූ හඬකින් මොර ගසමින් රජවාසල ඉදිරිපිට පැමිණුනේය. " (එස්තර් 4:1)** එස්තර් රැජිණ ද මෙලෙෂ පැවසුවාය. **"ගොස් ෂුෂන්හී සිටින සියලු යුදෙව්වරුන් රැස් කරවා මා උදෙසා ඔවුන් සමඟ දවස් තුනක් රෑ දහවල් නොකා නොබී නිරාහාරව සිටින්න. මමත් මගේ වැඩකාරියොත් එසේම නිරාහාරව ඉන්නෙමුව. එවිට නීතියට එකඟ නැති නමුත් මම රජු ළඟට යන්නෙමි. මා නැති වුණොත් නැතිවුණාවේ කියා කියන්ට කීවාය." (එස්තර් 4:16)** ඒ අනුව ආසන්නව තිබූ අනතුර ජයග්‍රහණයට හැරුණේය. එස්තර් රැජිණ සහ ඇගේ සෙනඟගේ මැදහත්කාරකම නිසා යුදෙව් සෙනඟගේ ආසන්නයේ තිබූ විනාශයෙන් ගැලවුනේය.

ඒ වන විටත් බබිලෝනියේ වහල්භාවෙය් සිටි ඔහුගේ සෙනඟවෙනුවෙන් දානියෙල් මුළු ආත්මයෙන්ම මැදහත්වූ ආකාරයත් සැලකිල්ලට ගන්න. **"එවිට මම නිරාහාරව, ගෝණි රෙදිද, අළුද ඇතුව, යාච්ඤාවෙනුත් කන්නලව්වෙනුත්, ස්වාමී වූ දෙවියන් වහන්සේ සොයන පිණිස මාගේ මුහුණ උන්වහන්සේ දෙසට හරවා මාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේට යාච්ඤාකොට පව් කියාදෙවින් මෙසේ කීවි. අහෝ ස්වාමීන් වහන්ස ඔබට ප්‍රේමකොට ඔබගේ ආඥා රක්ෂාකරන්නන්ට ගිවිසුවත්, කරුණාවත් පවත්වන්නා වූ මහත් වූ භයංකාරවූ දෙවියන් වහන්ස, අපි පව්කොට, අයුතුකම්කොට, දුෂ්ඨකම්කොට, කැරළිගසා ඔබගේ ශික්ෂාවලින්ද, ඔබගේ විනිශ්චයවලින්ද ඉවත්ව ගියෙමුව." (දානියෙල් 9:3-5)**

යෙරුසලමේ ඉතිරිව සිටියා වූ සෙනඟ විදින දැඩි පීඩාව නෙහෙමියා දැනගත් විට ඔහු මෙසේ කීවේය. **"මම ඒ වචන ඇසූකළ හිඳගෙන හඬා කීප දවසක් වැලපී නිරාහාරව සිට, ස්වර්ගයේ දෙවියන් වහන්සේ ඉදිරියෙහි මෙසේ යාච්ඤා කළෙමි."** (නෙහෙමියා 1:4) එහි ප්‍රතිඵලය වූයේ පර්සියාවේ රජුවූ අර්තක්ෂස්තා යෙරුසලම නැවත ගොඩනැගීම සඳහා මනුෂ්‍යයන් සහ අවශ්‍ය සම්පත් සමඟ නෙහෙමියාව යෙරුසලමට යවනු ලැබීමයි.

යෙෂියා රජතුමා වාසස්ථාවේ වචන ඇසූවිට තම සෙනඟවෙනුවෙන් දැඩි ලෙස වේදනාවට පත්විය. "රජ වනාහී වාසස්ථාවේ වචන ඇසූ විට තමාගේ ඇඳුම් ඉරාගත්තේය. " (2 ලේකම් 34:19) මහිමාන්විත අලුත්වැඩියාවීමක් කළ අතර යුධ දේශයේ තිබූ රූප නමස්කාරය පහකර දමා ඊට කලින් කිසිදාක නොතිබූ ආකාරයේ පාස්කු මංගල්‍යයක් පවත්වනු ලැබුවෝය. **"වේ ඉඬමටත් වෙහි වැසියන්ටත් විරුද්ධව දෙවියන් දෙවියන් වහන්සේ කියා තිබෙන වචන නුඹ ඇසූ විට නුඹේ සිත මොළොක්වී නුඹ උන්වහන්සේ ඉදිරියෙහි යටහත්වූ බැවිනුත්, නුඹ මා ඉදිරියෙහි යටහත්වී නුඹේ ඇඳුම් ඉරාගෙන මා ඉදිරියෙහි අඬූ බැවිනුත්, මමත් නුඹට කන්දුනිවියි ස්වාමීන් වහන්සේ කියන සේක."(2 ලේකම් 34:27)**

මෝසෙස් නිතරම ඊශ්‍රායෙල් පුත්‍රයන් වෙනුවෙන් මැදහත්කාරකම් කළේය. ඔහු අපගේ ශ්‍රේෂ්ඨතම මැදහත්කරුවාණන් වන ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙන් වූයේය. ඊශ්‍රායෙල් පුත්‍රයන් රන් වස්සාව සැදූ පසු ඔවුන්ගේ පාපය කමා කරන ලෙසත්, එසේ නොවන්නේ නම් දෙවියන් වහන්සේගේ පොතෙන් තමාගේ නම මකා දමන ලෙස ඇයැද සිටියෝය. **"එහෙත් දැන් ඔබ ඔවුන්ගේ පාපය ක්ෂමාකරන්ට කැමති වන සේක් නම් යහපත නැතහොත් ඔබ වහන්සේ ලියා තිබෙන පොතෙන් මා මකා දැමුව මැනවැයි කීවේය. " (නික්මයාම 32:32) "යමෙක් තමාගේ මිත්‍රයන් උදෙසා තමාගේ ජීවිතයදීමට වඩා මහත් ප්‍රේමයක් කිසිවෙකුට නැත." (යොහාන් 15:13)**

යේසුස් වහන්සේ මුළු රාත්‍රියේම මැදහත්කාරකමේ යාච්ඤාවෙහි නිරත වූ සේක. උන්වහන්සේ යෙරුසලම ගැන හඬා පොත්සෙමනේදී මැදහත්කාරකම් කරමින් ජයග්‍රහණය ලැබූ සේක. උන්වහන්සේ අපගේ දුර්වලකම් දන්නා වූ අපගේ උත්තම පූජකයානෝය.

"මක්නිසාද අපට සිටින්නේ අපේ දුර්වලකම්වලදී අපේ දුක නොදැනෙන උත්තම පූජකයෙක් නොව, පව් කිරීමක් නැතුව සියලු ආකාරයෙන්ම අප වාගේ පරීක්ෂා කරනු ලැබූ උත්තම පූජකයෙක්ය." (හෙබ්‍රෙව් 4:15)

අද දවසේ උන්වහන්සේ පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ සිටිමින් අප වෙනුවෙන් මැදහත්කාරකම් කරන සේක. "එබැවින් උන්වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහ්නසේ වෙතට ළඟා වෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින්. ඔවුන් කෙළවර දක්වාම ගලවන්ට උන්වහන්සේට පුළුවන." (හෙබ්‍රෙව් 7:25)

"එලෙසම ආත්මයාණන් වහන්සේත් අපගේ දුර්වලකම්වලදී උපකාර කරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤා කරන්ට අපි නොදනිමුව. නුමුත් ආත්මයාණන් වහන්සේම කිය නොහැකි කෙඳිරිගැසීම්වලින් අප උදෙසා මැදහත්කම් කරන සේක. ඒ ආත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේගේ කැමැත්ත ලෙස

6 පිටුවට

5 පිටවෙන්

කඩුල්ලේ සිටීමට කැඳවන සේක...

ශුද්ධවන්තයන් උදෙසා මැදහත්කම් කරන බැවින්, සිත් වීවසන තැනැත්තේ වහන්සේ උන්වහන්සේගේ අදහස කුමක්දැයි දන්නා සේක." (රෝම 8:26-27)

පිඹිදීමට කලින් ප්‍රසව වේදනාව ඉතිහාසයේ විශාලතම පිඹිදීම අත ළඟය. නමුත් එය පැමිණීමට පෙර එහි අති මහත් අවශ්‍යතාවය යම් අයට ගැඹුරින් දැනිය යුතුය. **"මෙබඳු දෙයක් ඇසුවේ කවුද ... ?**

මෙබඳු දේ දුටුවේ කවුද ... ? එක දවසකදී දේශයක් උපදිනවා ඇද්ද ... ? නොහොත් සෙනඟත් එකවිටම උපදිනවා ඇද්ද ... ? සියොන් ප්‍රසව වේදනාවින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන් වැදුවාය. " (යොසායා 66:8) දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ආත්මික දරුවන් බිහිවීමට පෙර ආත්මයේ ප්‍රසව වේදනාව තිබිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ වෙතට මනුෂ්‍යයන්ව ගෙන එන තැනැත්තාට ප්‍රථමයෙන් ආත්ම ගැලවීම ලැබීමේ ආශාවේ වේදනාවක් දැනිය යුතුය. දෙවියන් වහන්සේ මනුෂ්‍යයන්ව කැඳවන්නේ විනිශ්චයට මුහුණදීමට ආසන්නයේ සිටින අපගේ ජාතිය සහ ලෝකය වෙනුවෙන් මැදහත්කාරකම් කරමින් කඩුල්ලේ සිටීමටය. අපවිත්‍ර දේවලින් පිටතට පැමිණීමට දෙවියන් වහන්සේ මැදහත්කරුවන්ව කැඳවන සේක. ***"එබැවින් නුඹලා ඔවුන් අතරෙන් පිටතට ඇවිත්, වෙන්ව සිටපල්ලා. අපවිත්‍ර දෙයකට අත නොගසා සිටපල්ලා යයි ස්වාමීන් වහන්සේ කියන සේක. එවිට මම නුඹලා පිළිගෙන නුඹලාට පියෙක් වන්නෙමි. නුඹලාද මට පුත්‍රයෝත් දුවරුත් වන්නහු යයි සර්වපරාක්‍රම වූ ස්වාමීන්වහන්සේ කියන සේක."*** (2 කොරින්ති 6:17-18) මැදහත්කරුවන් ලෙස අපවිත්‍රකමින් වෙන්ව සිටීමට කැඳවූ බොහෝ දෙනා නොසැලකිලිමත් ජීවිත ගත කරමින් සිටිති. ***"මක්නිසාද කැඳවනු ලැබූවෝ බොහෝය. තෝරාගනු ලැබූවෝ ස්වල්පයයි කී සේක." (මතෙව් 22:14) "එබැවින් ඒ සිදුවෙන සියල්ලෙන් ජයගෙන ගැලවෙන පිණිසද, මනුෂ්‍ය පුත්‍රයා ඉදිරියෙහි සිටින පිණිසද කන්නලව් කරමින් සෑම කාලයේදීම අවදිව හිඳිල්ලා යයි කී සේක."(ලූක් 21:36)*** නොසැලකිලිමත් ජීවිතයකින් ජයග්‍රහණයක් ලැබීම පාවුල්තුමා බලාපොරොත්තු නොවීය. ඔහු මෙසේ කීවේය. ***"සහෝදරයෙනි, මම තවමත් අල්ලාගත්තෙවියි නොසිතමි. නමුත් එකක් කරමි. එනම්. පස්සෙන් තිබෙන දේ මතක නතිකොට, ඉස්සරහට තිබෙන ඒවා දෙසම බලාගෙන යමින් ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ උත්තම් කැඳවීමේ දිණුම පිණිස දිනුම්පල කරා දුවමි."*** (පිලිප්පි 3:13-14) අපගේ වුළු හදවතින්ම ස්වාමීන් වහන්සේව සොයමු. ***"එසේ වන්නේ උසස්ථානයෙන් ආත්මය අප කෙරෙහි වගුරුවන්ටත් කාන්තාරය ඵලනක් වෙන්ටත්, ඵලය වනයක් කොට ගණන්ගනු ලබන්ටත් යෙදෙන තුරුය. "*** (යොසායා 32:15)

"මා විසින් නුඹලා ගැන කරන යෝජනා මෙම දනිමි. නුඹලාට මතු කාලයේ දී බලාපොරොත්තුවක්දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනා යයි ස්වාමීන් වහන්සේ කියන සේක. නුඹලා මට අඬගසන්නහුය. ගොස් මට යාච්ඤා කරන්නහුය. මම ද නුඹලාට ඇහුම්කන් දෙන්නෙමි. නුඹලා මා සොයනවා ඇත. නුඹලාගේ වුළු සිතින් මා සොයන කළ මා නුඹලාට සම්බවෙනවා ඇත." (යෙරමියා 29:11-13)

සියලුදේම යාච්ඤාව කරුණුකොටගන

(අර්මින් ගෙස්වෙයින් විසිනි.) (1907-2001)

යාච්ඤා කිරීම උසස්ම හා ශුද්ධම කාර්යය වන අතර එය පොළොවේ වඩාත්ම නොසලකා හරින ලද දේව සේවය වේ. මැදහත්කම් කිරීම නැති නිසා දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියාවලින් හිඟව සිටින්නෙමු. අපගේ පරම්පාරව තවමත් යාච්ඤාව දේව සේවයක් ලෙස දැකීමටත් මේ කාරණය සම්බන්ධයෙන් දෙවියන් වහන්සේව උන්වහන්සේගේ වචනයෙන් වටහා ගැනීමටත් නොහැකිව සිටිති. අපගේ අදහස නම් "අපි යාච්ඤා කරමු. ඉන්පසුව වැඩ කටයුතු කරමු කියාය." නමුත් යාච්ඤා කිරීම අපගේ සැබෑ කාර්යයි. අපි නිතරම සිතන්නේ යාච්ඤා කිරීම වෙනත් කාර්යබහුල දෙයකට උපකාරයක් ලෙස පමණි. නමුත් දෙවියන් වහන්සේගේ ක්‍රියා සිදුවන්නේ අපි යාච්ඤා කරන විට සහ යාච්ඤා කරන අතරතුරදීය. යම් කෙනෙක් මේ කාරණය පිළිබඳව දෙවියන් වහන්සේගේ වචනය විශ්වාස කළ පසු යාච්ඤා කිරීම ඕනෑම දේව සේවකයෙකුට හෝ කිතුණුවෙකුට විප්ලවයක් ගෙන එයි.

ක්‍රිස්තුස් වහන්සේ මෙන් සහ ක්‍රිස්තුස් වහන්සේ සමඟ අපගේ ශ්‍රමය යෙදිය යුතු වන්නේ යාච්ඤා කිරීම තුළය. යේසුස් වහන්සේ දහඩිය කඳුළු සහ වේදනාව දක්වා යාච්ඤාවේ සේවයේ යෙදී සිටි සේක. දේව සේවයේ දී අපගේ ප්‍රධාන සේවය යාච්ඤා කිරීමේ සේවය වන අතර යේසුස් වහ්නසේගේ ද සේවය එය වූ සේක. එමෙන්ම දැන් එය උන්වහන්සේගේ එකම උත්තරීතර සේවයයි. මක්නිසාද උන්වහන්සේ අප වෙනුවෙන් මැදහත්කාරකම් කරන පිණිස සදාකාලිකවම ජීවත් වන සේක. ***"එබැවින් උන්වහන්සේ කරුණුකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත් වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගලවන්ට උන්වහ්නසේට පුළුවන."*** (හෙබ්‍රෙව් 7:25) දෙවියන් වහන්සේගේ ක්‍රියා සිදුකරනු ලබන්නේ යාච්ඤාව තුලිනි. එම නිසා යේසුස් වහන්සේ සැමවිටම ස්වර්ගීය පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ සිංහාසනයේ සිටිමින් මැදහත්කාරකම් කරන සේක. එය උන්වහ්නසේගේ පමණක් නොව අපගේ ද සේවය වේ. උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ අප වෙනුවෙන් පමණක් නොව අප තුළ ද සිට යාච්ඤා කරන සේක. ශුද්ධාත්මයාණන් වහ්නසේ අපට උන්වහන්සේගේම බලවත් යාච්ඤා කිරීම ලබාදෙන සේක. එය සැබෑම යාච්ඤාවයි. අපි උන්වහන්සේගේ යාච්ඤාව අනුකරණය කිරීම පමණක් නොව එයට ඇතුල්වීම, එය හිමිකර ගැනීම සහ අපි ඒ තුළට ඇතුල්වී තිබීමෙන් අපි උන්වහන්සෙගේ ක්‍රියාවලට ඇතුල්වන්නෙමු. එවිට අපි උන්වහන්සේ සමඟ හවුල් වැඩ කරන්නන් බවට පත්වේ. ***"මක්නිසාද අපි දෙවියන් වහන්සේගේ හවුල් වැඩ කරන්නෝය. නුඹලා දෙවියන් වහන්සේගේ කෙතය. දෙවියන් වහන්සේගේ ගොඩනැගිල්ලය. "*** (1 කොරින්ති 3:9) අපි අපගේම ක්‍රියාවලින් වැලකීමට ඉගෙන ග්නනේ ඒ තුලින්ය. මෙසේ අපි උන්වහ්නසේ වෙනුවෙන් වැඩ කරනවා වෙනුවට උන්වහන්සේ සමඟ වැඩ කරන්නන් බවට පත්වේ. එවිට අපි වහලුන් නොව උන්වහන්සේගේ පුත්‍රයන් සහ දූවරුන් බවට පත්වේ.

ඊළඟට අපි යාච්ඤා කිරීමෙන් අනතුරුව අපි යේසුස් වහන්සේ සමඟ යාච්ඤා කිරීමට පිළිතුරු වශයෙන් උන්වහන්සේ කර ඇති ක්‍රියාවන් වෙත ගමන් කරන්නෙමු. යාච්ඤා කිරීම අපගේ සැබෑ කාර්යයි. උන්වහන්සේගේ රාජ්‍යයේ සේවය කරන්නේ කවුද .. ? එබඳු ආකාරයෙන් යාච්ඤා කරන අයවේ. ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් ජයග්‍රහණයෙන් ජයග්‍රහණයට පැමිණෙන් අතර අනිත් අයට ද මඟපෙන්වනු ලබයි. අපි දෙවියන් වහන්සේ සමඟ වැඩ කරන විට, එනම් අපි යාච්ඤා කරන විට දෙවියන් වහන්සේගේ ක්‍රියා කිරීම අපි දකින්නෙමු. ***"එබැවින් නුඹලාගේ වරද එකිනෙකාට කියා දී, සුව ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤා කරපල්ලා. ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඵප්පු කරන කන්නලව්ව කරුණුකොටගෙන වහන් දේ ඉෂ්ඨවෙයි. "*** (යාකොබ 5:16) දෙවියන් වහන්සේ සමඟ සියලුම දේ උදෙසා යාච්ඤා කිරීම නොව නමුත් සැමදේම යාච්ඤා කිරීම කරුණුකොටගෙන වන්නේය.

යාච්ඤා කිරීම දෙවියන් වහ්නසේගේ කැමැත්ත සම්පූර්ණ කරන්නේය.

දෙවියන් වහන්සේ යම් කාර්යයක් කිරීමට සූදානම් වන විට උන්වහන්සේ තම සෙනඟව යාච්ඤා කිරීමට යොමු කරවනු ලබන සේක. දෙවියන් වහන්සේට කළ හැකි දේ අපට ලැබෙන්නේ අපි යාච්ඤා කරන විට පමණි. දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් පිටත තිබෙන දේ හැර යාච්ඤා වළල්ලෙන් පිටත කිසිවක් නැත. ***"උන්වහන්සේ ද ඔවුන්ට කියන සේක්, නුඹලා යාච්ඤා කරන කළ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා. ඔබගේ රාජ්‍යය ඒවා. අපගේ දවස්පතා භෝජනය අපට දවසින් දවස දුන මැනව. අපේ පව් අපට කමා කළ මැනව. මක්නිසාද අපට ණයව සිටින සියල්ලන්ට අපිත් කමාවෙමුව. අප පරීක්ෂාවට නොපැවිණෙවුව මැනවැයි කියාපල්ලා යි කී සේක. "***(ලූක් 11 : 2-4)

"නුඹලා මා තුලෙහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුලෙහි පවතී නම් නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා. එවිට නුඹලාට ලැබේ." (යොහාන් 15:7) ***"මක්නිසාද තමන්වහන්සේගේ යහපත් කැමැත්ත නිසා, කැමතිවෙන්ටත්, වැඩකරන්ටත්, නුඹලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන් වහන්සේමය."*** **(පිලිප්පි 2:13)**

බයිබලයේ දෙවියන් වහ්නසේගේ කැමැත්ත අනාවරණය කරන අතර යාච්ඤා කිරීම තුළ එය සම්පූර්ණ වේ.

ස්වාමීන් වහන්ස, යාච්ඤා කිරීමට අපට ඉගැන්වුව මැනව

අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ සිටින්නේ කොපමණ දුරකින්ද ... ? අපගේ වර්ධනය කොපමණ විශාලද .. ? අපගේ වර්ධනය අපගේ හැකියාව, අපගේ කිතුණු පරිනතභාවය යන කාරණා වලින් අපගේ යාච්ඤා ජීවිතය පෙන්නුම් කරනු ලබයි. මක්නිසාද අපගේ සැබෑ ගෝලත්වය ඇත්තේ යාච්ඤාවේ පාසලේදීය. එලෙසම අපගේ සියලුම කටයුතු (කාර්යයන්) සහ හික්මවීම් දෙවියන් වහන්සේ මෙහි ඇතුළත් කර තිබෙන සේක. යාච්ඤා කිරීමේ දී මෙන් වෙනත් අවස්ථාවකදී අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ සිටින්නේ නැත. කිතුණු ජීවිතය යාච්ඤාව උදෙසා තිබෙන ජීවිතයකි. අපි යාච්ඤා ජීවිතය ගැන කථා කළ යුතුය. අපගේ ආත්මික ජීවිතයේ වර්ධනය පිළිබඳ නියම මිනුම් දණ්ඩ එයයි. එය අපගේ බලයේ නිම මට්ටමයි. සාතන්ට අවශ්‍යව තිබෙන්නේ අපගේ බලයට පහරදීමට නොව, අපගේ යාච්ඤා කිරීමට පහරදීමටයි.

ගෝලයන් යේසුස් වහන්සේ සමඟ ඉදිරියට යද්දී යේසුස් වහන්සේගේ මහත් වූ රහස යාච්ඤා කිරීම තුළ ඇති බව ගෝලයන් ඉගෙන ගන්නට පටන් ගත්තෝය. උන්වහන්සේගේ මහත් වූ රහස ඔවුන්ගේ බවට පත්විය යුතු බවට යේසුස් වහන්සේ දැඩි උනන්දුවෙන් සිටි බවද ඔවුන් සොයාගත්හ. උන්වහන්සේගේ පොරොන්දු, උන්වහන්සේගේ නියෝග, උන්වහන්සේ උපමා සහ සියල්ලට ඉහළින් උන්වහන්සේගේ ආදර්ශය යන සියලු දේ ඔවුන්ට ලබා දුන් සේක. අපගේ ස්වාමීන් වහන්සේ ස්වර්ග යට යාමට ආසන්න වූ විට අනිත් ඕනෑම දෙයටක වඩා සැබවින්ම යාච්ඤා කරන්නේ කෙසේදැයි ගෝලයන්

7 පිටුවට

6 පිටවෙන්

සියලුදේම යාච්ඤාව...

දැන සිටියෝය. එහි රහස ඔවුන් සතුවිය. ඇදහිල්ල සහ යාච්ඤාව හොඳින් ඔවුන්ට උගන්වා තිබූ සේක. ඔවුන් සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ වචනය විශ්වාස කළ නිසා සහ ඔවුන්ව විශ්වාස කිරීමට උන්වහන්සේට හැකි වූ නිසා දැන් උන්වහන්සේට පිටත්ව යාමට හැකි වූ සේක. ඔවුන් ශුද්ධාත්මයාණන් වහන්සේව ලබාගත්තෝය. එය ඔවුන්ගේ ආරම්භය විය. එතැන් පටන් ක්‍රියා පොතේ පරිච්ඡේදයෙන් පරිච්ඡේදය ඔවුන් ස්වාමීන් වහන්සේ ඉදිරියේ දණින් වැටෙමින් ඉදිරියට ගියෝය. හැම දෙයක්ම යාච්ඤාව කරුණුකොටගෙන විය. ඊට ප්‍රධාන හේතුව ඔවුන්ගේ සහ අපගේ මුළු ජීවිතයම නිරන්තරයෙන් ආශ්චර්යමත් පදනමක පැවතීමයි. එය සෑම දෙයකටම නිවැරදිව පැමිණීමටත්, ඒවා ඉටු කිරීමටත් සෑම කාරණයකදීම යාච්ඤාකිරීම කරුණුකොටගෙන යාච්ඤාවෙන් පූර්ණව ස්තුති දෙමින් ඉදිරියට යාමටත්, සියල්ල තුළ සිටින්නා වූ උන්වහන්සේට සියලු මහිමය ලබාදීමටත්ය.

"තවද උන්වහන්සේ එක් තැනක යාච්ඤා කරමින් සිට නිමවූ පසු උන්වහන්සේගේ ගෝලයන්ගෙන් එක්කෙනෙක් කථාකොට, ස්වාමිනී ඉගැන්වුව මෙනවැයි කීවේය." (ලූක් 11:1)

පසුගිය කලාපයෙන්

ජීවිතය සහ අවසාන...

ආත්මික යුද්ධයෙන් ජය ගැනීමට මෙම දිව්‍යමය බලය අවශ්‍ය වේ. **"ඉතින් ස්වාමීන් වහන්සේ තුළ ද, උන්වහන්සේගේ ශක්තියේ බලවත්කමෙහිද බලවත්වෙයල්ලා. යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන් වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා."** (එපීස 6:10-11) **"මක්නිසාද අපේ යුද්ධායුධ මාංශික නොවේය. එහෙත් ඒවා බලකොටු බිඳහෙලීමට දෙවියන් වහන්සේ ඉදිරිපිට බලසම්පන්නය."** (2 කොරින්ති 10:4)

මෙම දිව්‍යමය බලය උදෙසා දැඩි ලෙස උත්සාහ කළ යුතුය. **"ප්‍රීතිය ඇතුව සියලු ආකාර ස්ථිරකමටත්, ඉවසිලිවන්තකමටත් , උන්වහන්සේගේ තේජසේ පරාක්‍රමයේ හැටියට සියලු ආකාර බලයෙන් ශක්තිමත් වෙමින්ද, ආලෝකයේ සිටින ශුද්ධවන්තයන්ගේ උරුමයෙන් කොටසකට අප සුදුස්සන් කළා වූ පියාණන් වහන්සේට ස්තුති කරමින්ද, නුඹලා ස්වාමීන් වහන්සේට ඛඩින ලෙස සියලු ආකාරයෙන් ප්‍රසන්නව හැසිරෙන ලෙස ඉල්ලමුව."** (කොලොස්සි 1:11-12)

මෙම දිව්‍යමය බලය දුක්විඳීම් දරා ගැනීමට හැකියාව ලබාදෙයි. **"මක්නිසාද දෙවියන් වහන්සේ අපට දුන්නේ බයාදුකමේ ආත්මක් නොව බලයෙන්, ප්‍රේමයෙන්, හික්මවීමෙන් ආත්මයක්ය. එබැවින් අපගේ ස්වාමීන් වහන්සේගේ සාක්ෂිය ගැනවත් උන්වහන්සේගේ හිරකාරයෙක් වන මා ගැනවත් ලැජ්ජා නොවී, දෙවියන් වහන්සේගේ බලයේ ප්‍රකාරයට ශුභාරංචිය නිසා මා සමඟ දුක්විඳපන්න."** (2 තිමෝති 1:7-8)

දුබලතාවයන් මධ්‍යයේ, අවශ්‍යතාවයන් මධ්‍යයේ නින්දාවන් මධ්‍යයේ, පීඩාවන් මධ්‍යයේ, දැඩි වේදනාවන් මධ්‍යයේ ශක්තිමත්ව සිටීමට අපව ගොඩනගන සේක. **"උන්වහන්සේද, මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණ වන්නේ යයි මට කී සේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා ස්නතෝෂයෙන් පාරට්ටු කරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා පැමිණෙන දුර්වලකම්වලටත්, අන්තරායවලටත්, හිඟකම්වලටත්, පීඩාවලටත්, විපත්තිවලටත්, ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව සිටින කලම ශක්තිමත්ව සිටිමි."** (2 කොරින්ති 12:9-10)

සේවය උදෙසා මෙම දිව්‍යමය බලය **"ස්තේපන් අනුග්‍රහයෙන්ද, බලයෙන්ද පූර්ණව, පුදුමද , භාස්කම්ද සෙනඟ අතරේ සිදු කළේය."** (ක්‍රියා 6:8) **"ඒ අර්ථ මා තුළ බලවත් ලෙස කෙරෙන උන්වහන්සේගේ ක්‍රියාකිරීමේ ප්‍රකාරයට ඒ සඳහා මම පොර අල්ලමින් වීර්යය කරමි."** (කොලොස්සි 1:29)

දෙවියන් වහන්සේගේ පූර්ණත්වයෙන් සහ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයෙන් මෙම දිව්‍යමය බලය කරුණුකොටගෙන අපව පූර්ණ කරන සේක. **"උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තින් වන පිණිසත්, අදහිල්ල කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ නුඹළාගේ සිත් තුළ වාසය කරන පිණිසත්, නුඹලා ප්‍රේමයෙහි මුල් අද පිහිටා සිට, දෙවියන් වහන්සේගේ පුළු පූර්ණකමට පූර්ණ වන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්ට නුඹලාට පුළුවන්වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි."** (එපීස 3:16-19)

මෙම දිව්‍යමය බලය අපව ප්‍රීතිය, සමාදානය සහ බලාපොරොත්තුවෙන් පූර්ණ කරන සේක. **" ඉදින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් නුඹලා අධික බලාපෙරොත්තුවෙන් යුක්තව සිටින පිණිස බලාපොරොත්තුවේ දෙවියන් වහන්සේ අදහිල්ලෙන් වූ සියලු ප්‍රීතියෙන්ද, සමාදානයෙන්ද නුඹලා පූර්ණ කරන සේක්වා."** (රෝම 15:13)

සුභාරංචිය තුළ වචනය සහ බලය

මේ සියලු දේ කල්පනාවේ තබා ගනිමින් පෙරමඟ දූතයා කාර්ය මණ්ඩලය මේ අන්තිම දවස්වලදී ජීවිතයේ සහ සේවයේ දෙවියන් වහන්සේගේ බලයෙන් පූර්ණවීම උදෙසා ස්වාමීන් වහන්සේව සෙවීමට උද්යෝගිමත් කිරීම මෙම කලාපයේ පණිවිඩ තුළින් බලාපොරොත්තු වේ. යේසුස් වහන්සේගේ පැමිණීම ළංවීමේ දී සුභාරංචිය පැතිරී යන බව යේසුස් වහන්සේ ලබා දුන්නා වූ ලකුනු වලින් එකක් බව මතකයේ තබාගන්න. **"රාජ්‍යයේ වේ සුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව වුළුල්ලේ ප්‍රකාශ කරනු ලබන්නේය. එවිට අන්තිමය පැමිණෙන්නේය."** (මතවේ 24:14) එලෙසම අපෝස්තුළු පාවුල් තෙසලෝනිකවරුන්ට සුභාරංචිය මතක් කර දෙන්නේය. **"මක්නිසාද අපේ සුභාරංචිය නුඹලා වෙතට පැමිණුනේ වචනයෙන් පමණක් නොව බලයත් ශුද්ධාත්මයත් බොහෝ නිසැකකමත් ඇතුවය. එසේය නුඹලා නිසා අපි නුඹලා අතරෙහි කොයි ආකාර අය වීවුදැයි නුඹලා දන්නහුය."** (1 තෙසලෝනික 1:5) අප වටා සහ ලෝය වටා අද දවසේ අවශ්‍යතාවය වන්නේ ඇදහිලිවන්තයන් ඔවුන්ගේ ජීවිතවල සහ සේවයේදී දෙවියන් වහන්සේගේ බලය කරුණුකොටගෙන ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය පතුරුවා හැරීමයි.

"ඉතින් අප තුළ ක්‍රියාකාරන්නා වූ බලයේ හැටියට අපි ඉල්ලන නොහොත් සිතන හැමදේටම වඩා ඉතා අධික ලෙස කරන්ට බලය ඇත්තා වූ තැනැත්තා වහන්සේටම සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් යෙසුස් වහන්සේ තුළ සදාකාලයටම ගෞරවය වේවා....! ආමේන් ...! " (එපීස 3:20-21)

පුරන්නිම කොටාගන්න.

සංස්කාරකගෙන් සටහනක්

1944 සිට පෙරමඟ දූතයා පත්තරයේ පැරණි සංස්කරණයන් කියවද්දී මිෂනාරිවරුන්ගේ ජීවිත සහ සේවාවන්වල දෙවියන් වහන්සේ පිඹීදීම ඇතිකරනු ලැබීම පිළිබඳව අගනා වාර්තා කිහිපයක් සොයා ගත්තෙමු. සී.ටී. ස්ටුඩ් විසින් ආරම්භ කරන ලද මිෂනාරී වයාපාරය තුළ පසුතැවිල්ලෙන් සහ යාච්ඤාවෙන් යුතුව සම්පූර්ණයෙන්ම හැරෙන හැරෙන විට ස්වාමීන් වහන්සේගේ කරුනාවෙන් පිඹීදීම එවන ආකරය පිළිබඳව පුදුමාකාර සිදුවීම් දෙකක් සාක්ෂි සහිතව පහතින් සඳහන් කරන්නෙමු.

එක් මිෂනාරිවරයෙකුගෙන්

මම ඉන්දියාවට පැමිණ වැඩිකල් ගතනොවීය. මම ලැජ්ජා සහගත ලෙස වෙනත් මිෂනාරිවරුන්ව විනිශ්චය කිරීමට සහ අපහාස කිරීමට ඉබාගාතේ ගිය අතර ගැටුම්කාරී සිතුවිලි සහ භාෂා ආරවුල්වල පටලැවී අතරමංවී සිටියෙමි. මේ සියල්ල තුළ ඇදහිල්ල සහ ආදරය කොයිරතම් ආගන්තුකද .. ? මට ඔවුන්ව සම්පූර්ණයෙන්ම නොපෙනී ගිය අතර පිඹීදීම සඳහා වූ මාගේ යාච්ඤාව නිකම්ම උමතු වචන දක්වා වර්ධනය වූ අතර අහස වියලීමට හේතුවූයේ යැයි මම සිතූ අයව හෙළා දැක්කෙමි. මාගේ ඇස් මිෂනාරී සේවයේ කාරණා වෙතම යොමු වෙනවා වෙනුවට සුභාරංචිය ප්‍රකාශ නොකරන්නන් වෙතට යොමු විය. මම දුටු (දකින) ආකාරයට මම මාව ගොඩනගා ගැනීමට පටන් ගතිමි. මම විවිධ පැතිවලින් පුද්ගලිකව පාපයට වැටුණු අතර පිඹීදීම උදෙසා යාච්ඤා කිරීම සම්පූර්ණයෙන්ම නතර විය.

ඊළඟට යම් දෙයක් සිදු විය. මම තිනවම ජීවත්වෙද්දී බලාපොරොත්තු රහිත තත්ත්වයට පත්වුණි. උදැසන සහ සවස ශක්තිය හැර මගේ ජීවිතයේ අපේක්ෂා කළ යාච්ඤාව ප්‍රායෝගිකව අහිමිවී ගොස් තිබෙන බව දෙවියන් වහ්නසේ මුලින්ම මට පෙන්වූ සේක. දැඩි සහ නොවතින මැදහත්කාරකම් කිරමක් අවශ්‍යව තිබෙන බව මම දුටුවෙමි. එබැවින් යාච්ඤා කිරීමට මාගේ ජීවිතය භාර දුනිමි. ඉන්පසුව පුද්ගලික පාපය සහ පසුබැසීම ගැන ගැඹුරු පසුතැවිලිවීමක් අනුගමනය කළෙමි. එක් කාරණයකට පසු තවත් කාරණයකින් නැවත නැවත උන්වහන්සේව වේදනාවට පත්වෙනවා සහ උන්වහන්සේගේ රාජකීය සමාවදීම ඇසෙන විට මාගේ හදවත බිඳී ගියේය. උන්වන්සේගේ ඉවසීම ගැන මම මවිතයට පත්වූයෙමි. අවසානයේ දී උන්වහන්සේ උදහසින් මාව අත්හැර ගියහොත් යන බියෙන් වෙව්ලන්නට විය. කිරුළු පැළඳි උන්වහන්සේගේ තේජස දකින තෙක් මේ බිය මට දැණුනි. උන්වහන්සේ බැටළු පැටවාණෝය. උන්වහන්සේ වරක් තුවාල ලැබූ සේක. එම කැළැල් සදාකාලිකව පවතින අතර අපට ලබා දැන්නා වූ ආදරය කිසිදාක වෙනස් වන්නේ නැත.

මෙම සත්‍යතාවය මම අවබෝධ කරගත් විට ක්‍රිස්තියානි ජීවිතය තුළ ඇති ප්‍රතිපත්ති කිසිවක් හිස් නොවන බවත් ඒවා ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලභාවය පෙන්වන බවත් අවබෝධ කර ගගතිමි. යාච්ඤා කිරීමට ප්‍රබෝධය නැති විට, මම කොළයක්, පැනක් ගෙන මාගේ හදවත උන්වහන්සේට ලියූවෙමි. බොහෝ විට පිටුවක් අවසන්වීමට පෙර මම හදවතින්ම උන්වහන්සේගේ පාමුල වැටුණෙමි. මම උන්වහන්සේට ආදරය කිරීමට යොමුවූයෙමි. මාගේ ජීවිතයට වඩා උන්වහන්සේට ආදරය කළෙමි. කදුළු හැර වෙන කිසිවක් පැමිණියේ නැත. ඉන්පසු යටහත් වෙමින් මාගේ පාපය ගැන විවෘතව පසුතැවිලි වෙන්නට පටන් ගත්තෙමි. මට ලැජ්ජාව දැනෙ විට උන්වහන්සේ ඉතා කරුණාවන්ත වූ සේක. එතැන් සිට මම උන්වහන්සේගේ පිඹීදීම ගැන උන්වහන්සේට ස්තුති කළ අතර උන්වහන්සේ මා සමඟ ක්‍රියා කිරීමට පටන් ගත් සේක. පිඹීදීමේ බලය නැති කරන්නා වූ ඕනෑම ක්‍රිස්තියානි ක්‍රියාකාරකමක්

Reg. No: DOP/NEWS/21/2023
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

ආත්මයේ ක්‍රියාකාරකමක් නොවන බව මම පුද්ගලිකව විශ්වාස කරමි. එලෙස බලය නොමැතිවීමට හේතු වන්නා වූ බොහෝ කාරණා තිබේ. එනම් ඇදහිල්ල නොමැතිකම, දුෂ්කර තත්ත්වයන් , දැඩි හදවත් වැනි බොහෝ හේතු අපට පෙනෙන්නට ඇත. ඇත්ත වශයෙන්ම සැබෑ ප්‍රශ්නය දැකීමෙන් අපව වළක්වන්නා වූ ඕනෑම දෙයක් පාපයයි. දෙවියන් වහන්සේට යම් කාර්යයක් කිරීමට අවශ්‍ය වූ විට දුෂ්කර තත්ත්වයන් සහ දැඩි හදවත් නොමැත.

මිෂනාරි කාන්තාවකගෙන්

අපි පළමුවෙන් පිඹීදීම ගැන යාච්ඤා කිරීමට පටන් ගත් විට පිඹීදීම පිළිබඳ ෆිනීගේ දේශනා විශේෂයෙන් පුරන් බිම කොට ගැනීම පිළිබඳ දේශනා භාවිතා කළෙමු. ෆිනී යෝජනා කළේ පෑනක්, කඩදාසියක් ගෙන ස්වාමීන් වහන්සේ සිතට හඟවා දෙන පසුතැවිලි වී අත්හැර දමා නැති පාප සටහන් කරගන්නා ලෙයසි. ස්වාමීන් වහන්සේ අපව හෝ අප තුළින් වෙනත් අයව උද්යෝගිමත් කිරීමට පෙර මටය අවශ්‍යය බව ඔහු පැවසීය. වැඩිකල් යන්නට ප්‍රථමයෙන් අප නොදැන සිටි ගැඹුරු පාපයන් අපගේ හදවත්වල ඇති බව අපට පෙනෙන්න පටන් ගත්තේය. දෙවියන් වහන්සේ අපගේ හදවත් තැලීමට පටන් ගත්තේ කලින් අපි පහසුවෙන්ම සුළුකොට තැබූ දේවල් ගැනය. වසර ගණනාවක් නොසලකා හැර තිබූ දේවල් පිළිබඳව පසුතැවිලි වූයෙමු. ස්වාමීන් වහ්නසේ එකින් එක දේවල් එලිදරව් කළ බැවින් පාපය සම්පූර්ණයෙන්ම දරාගත නොහැකි විය. එය සැබෑ ලෙස රෝම 6 වන පරිච්ඡේදය අත්දැකීමක් වූයේය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ සම්පූර්ණත්වය අප තුළට අවශ්‍ය බව අපි තේරුම්ගත්තෙමු. අපව සම්පූර්ණයෙන්ම පිරවීම සඳහා දෙවියන් වහ්නසේ අපව සම්පූර්ණයෙන්ම හිස් කළ යුතුය. උන්වහන්සේ කරමින් සිටින්නේ මෙයයි.

වැඩ කටයුතු කරගනෙ යද්දී අපට දෙවියන් වහන්සේ කෙරෙහි පාපාසයක්, උන්වහන්සේ කෙරෙහි දැඩි ආශාවක් ඇතිවීමට පටන් ගත්තේය. අපි ප්‍රකාශ කළ සම්පූර්ණත්වය පිළිබඳ පොරොන්දු දේව වචනයෙන් සෙව්වෙමු. මාගේ අවධානය යොමු වූ එක් බයිබල් පදයක් නම් ... "ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශීර්වාද ලද්දෝය. මක්නිසාද ඔවුහු තෘප්තියට පැමිණෙන්නෝය. "(මතෙව් 5:6) අපට පිපාසය සහ ආශාව තිබුණේය. සාතන් කිසිම ආකාරයකින් අපව අත්හැරයාමට ක්‍රියා කළේ නැත. අපට බොහෝ අභ්‍යන්තර සටන් තිබුණි. ප්‍රධාන වශයෙන් යාච්ඤා කිරීමට තිබූ ආශාව මදිකම සහ නොපෙනෙන්නාවූ ස්වර්ගීය දේවල් ගැන ආශාවෙන් අපගේ හදවත් පෙළෙන විට සම්පූර්ණයෙන්ම පෙනෙන ස්වභාවික දේවල් ගැන කථා කිරීමේ ප්‍රවණතාවයක් තිබුණි.

ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ පූර්ණත්වය අපට ලබාදීමට බලා සිටින බව හැගෙන රාත්‍රියක් පැමිණියේය. අපි ඒකත්වයක් ඇතිව සිට අතර එය පූජණීය (ශුද්ධ) කාලයක විය. මම සැබවින්ම ක්‍රිස්තුස් වහන්සේගේ පංගුකාරයෙකු බව මට හැගී ගිය අතර මා සිටි කාමරයේ උන්වහ්සේගේ අභිමුඛත්වය කොයිතරම් පැවතුණාද කියනවා නම්, උන්වහන්සේ තම දැත් සහ එක් අංශයක් පෙනෙන සේ මේසය අසල සිටගෙන සිටින්නේදැයි බැලීමට මගේ දැස් ඇරීමට සිදුවූයේය. එදින සවස මා දන්නා තරමින් මාව සම්පූර්ණයෙන්ම ස්වාමීන් වහන්සේට භාරදුනිමි. මම මගේ කාලය මගේ මුදල්, මාගේ සෙනෙහස, මාගේ දක්ෂතා වෙන වෙනම උන්වහන්සේගේ දැත් මත තැබූවෙමි. උන්වහන්සේ ඒවා භාරගන්නා බව දැන සිටිමේ. එදින සවස උන්වහන්සේගේ පූර්ණත්වය මගේ බ වමට ගැඹුරු සහතිකයක් තිබුණි. ඔබ මෙම ගීතිකාවේ වචන දන්නවාද ... ? ගැලවුම්කරුවාණෙනි..., මම ඇදහිල්ලෙන් සෑම යහපතකම උල්පත වන ඔබවහන්සේව ස්පර්ශ කරමි. ඔබවහන්සේගේ ලේ වලින් පවිත්‍ර කිරීම කරුණුකොටගෙන දැන් ගුණවත්කම ප්‍රකාශ කරමි.

අපි ලබාගත්තෙමු. උන්වහන්සේ සැපයීමට පටන්ගත් පසු අපගේ හදවත් සාගින්නෙන් පෙළුණු දේ අප තුළ සහතික ලෙස සතුටින් පිරී ඉතිරී ගියේය. අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ අළුත් ජීවිතයකට ඇතුල් වූ බව අපි දැනගත්තෙමු. කලින් සිටියාට වඩා බොහෝ සෙයින් මම ක්‍රිස්තුස් වහන්සේට ළංව සිටින බ වමට දැණුනි. මම ඒ සඳහා සූදානම් වූ වහාම ස්වාමීන් වහන්සේ බොහෝ දේ මට දීමට යන බව මම දැන ගතිමි. එදා සිට අද වන තෙක් අපි හැමදාම ස්වර්ග ය ස්ථානවල ගමන් කර ඇත. නමුත් අපි දෙවියන් වහන්සේට හෝ මනුෂ්‍යයාට හෝ ඒ දෙදෙනාටම හෝ අපගේ පාපය පිළිගෙන පසුතැවිලි වන බව ප්‍රකාශ කරන තුරු කණස්සල්ලෙන් සිටින්නෙමු.

දවස්පතා කුරුසපත්වීම

ඊළඟට ස්වාමීන් වහන්සේ අපගේ දැස් එම උද්යෝගයෙන් ඉවතට ගෙන ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසිය දෙසට හැරවූ සේක. අපගේ ගැලවුම්කරුවාණෝ අප උදෙසා අපට කලින් දරාගත්දේ කොපමණ දුෂ්කරදැයි අපට දැනෙන තෙක් කුරුසිය වෙතට අපව යොමු කළ සේක. අපි එය බලන වාරයක්, වාරයක් පාසා අපගේ සත් දියව ගියේය. ක්‍රිස්තුස් වහන්සේගේ අභිමුඛත්වය ගැන මට හොඳ අවබෝධයක් තිබුණි. මා වෙනුවෙන් මරදාමනු ලැබූ බැටළු පැටවානන් වන උන්වහන්සේට දණින්ට වැටී නමස්කාර කළෙමි. උන්වහන්සේ ජීවමානයි.., ජීවමානයි ...., කියා මම, මටම කියා ගතිමි. මගේ ජීවිතයේ මම ඇත්තටම පළමු වාතවට උන්වහන්සේට නමස්කාර කළාක් මෙන් මට දැණුනි. එතැන් සිට ක්‍රිස්තුස් වහන්සෙ සමඟ නව සම්බන්ධතාවයක්, යාච්ඤා කිරීමට අළුත් ආශාවක්, දේව වචනය පිළිබඳව අළුත් අවබෝධයක් ඇති විය.

දවස් ගෙවී යද්දී ස්වාමීන් වහ්නසේ කුරුසිය අපගේ හදවත් මත තැබූ සේක. අපි වැඩි වැඩියෙන් කාරණාවන් පිළිගෙන පසුතැවිලි වන තරමට කුරුසියේ ඇණ ගැසිය යුතු දේ ආලෝකයට ගෙන ඒමට ස්වාමීන් වහන්සේට හැකිවීම පුදුමයක් නොවේ. ඒ දවස්වලදී සිංහාසනය මත සිටින බැටළු පැටවාට නමස්කාර කිරීමට හොඳ කාලයක් ගථ කළෙමු. අපගේ දැස් නොනවත්වාම කුරුසිය දෙසට යොමු විය. පෙන්ලුවිස් මහත්මිය ලියන පරදි "කුරුසිය ආත්මය වෙතට යොමු කරයි. ආත්මය කුරුසිය වෙතට මගපෙන්වයි."

ඇදහිල්ල දෙවියන් වහන්සේගේ වචනයට ගෞරව කරයි.

දෙවියන් වහන්සේ ඇදහිල්ලට ගෞරව කරන සේක.

දෙවියන් වහන්සේව මහිමයට පත් කළ හැකි තවත් ක්‍රම දෙවියන් වහන්සේ අපට පෙන්වා දෙන සේක. රෝම 4:20-21 පදවල අපට මෙලෙස පවසා ඇත. "එසේය, දෙවියන් වහන්සේගේ පොරොන්දුව දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව දෙවියන් වහන්සේට ගෞරව කරමින් පොරොන්දු වූ දේ ඉෂ්ඨ කරන්ට උන්වහන්සේට පුළුවන කියා නිසැකව විශ්වාස කළේය." (රෝම 4:20-21) දෙවියන් වහන්සේට අවශ්‍යව ඇත්තේ අපි උන්වහන්සේගේ වචනය දැඩි ලෙස විශ්වාසකර මේ ආකාරයෙන් උන්වහන්සේව මහිමයට පත් කිරීමට බව අපි දුටුවෙමු. මේ අවස්ථාවේදී අපට ලබා දුන් පිඹීදීම නැවුම් පොරොන්දුවක් විය. (යොහාන් 7:37-38) අපි ඇදහිල්ලෙන් පොරොන්දුව මත නැගී සිට, අවිශ්වාසයෙන් පැකිලී නොගියොත් "ජීවමාන ජල ගංගා" නිසැකවම පැමිණෙන බවට තහවුරු කරන සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ ජයග්‍රහණය

යොෂුවා 5 වන පරිච්ඡේදයේ සඳහන් දර්ශනයේ සිටින ස්වාමීන් වහන්සේගේ සේනාවේ අධිපතියා පිළිබඳ පින්තූරය ඉතා ප්‍රයෝජනවත්ය. පෙනෙන සටනට අමතරව ඒ හා සමඟ සදම්බන්ධ වූ නොපෙනෙන සටනක් පැවතුණි. ස්වාමීන් වහන්සේගේ සේනාවේ අධිපතියා අදින ලද කඩුවක් රැගෙන අන්ධකාරයේ සේනාවන් පරාජයට පත්කර (පලවාහැර) ඉදිරියට ගිය සේක. අපිද බලය සහ සාතන්ට අයිතිව තිබෙන ප්‍රදේශ සමඟ පොරබැදීම ගැනත්, අප වටා ඇති අන්ධකාරයේ සේනාවන් පරාජය කිරීම ගැනත්, දැනුවත්ව සිටිමු. ක්ෂණික යාච්ඤාව සහ ක්‍රියාව ඉල්ලා සිටින තත්ත්වයකට මුහුණ දෙන විට අපි මෙය විශේෂයෙන් දනිමු. අපගේ සේනාපතියා ආත්මික යෙරිකෝවට එරෙහිව අපට ඉදිරියට ගෙන යන බව නිශ්චිතවම දන්නා හෙයින් අපි පෙනෙන දේවල් සිතේ රදවා නොගෙන සාතන්ට පහර දෙමින්, කල්වාරියේදී ක්‍රිස්තුස් වහන්සේ සාතන්ව පරාජයකර ලැබූ ජයග්‍රහණය මත සිටිමු.

අපි ප්‍රකාශ කරන සතුරාට එරෙහිව දැන් යේසුස් වහන්සේගේ නාමයෙන් ජයග්‍රහණය කර නිරයේ සියලුම සේනාවන් කල්වාරියේ ජයග්‍රහණය මත පලවා හැරිය යුතුය. යේසුස් වහන්සේ මරණයට පත්වූයේ පාපයෙන් සහ මාංශයෙන් පරීක්ෂාවේ පැයෙන් ජයග්‍රහණය ලබාදීමට වන සේක. උන්වහන්සේ සාතන්ගේ බලය පොඩිකර දැමූ සේක. අපගේ විරුද්ධවාදියා වන සාතන්ට විරුද්ධව අපට ජයග්‍රහණය තිබේ. යේසුස් වහන්සේගේ නාමයෙන් අපට දැන් ජය තිබේ. ක්‍රිස්තුස් වහන්සේගේ ජයග්‍රහණය අපට අයිති වේ. කල්වාරියේ උන්වහන්සේ සමඟ සිටීමෙන් අපගේ ජීවිතවලට ජයග්‍රහණය ලැබේ. ලෝකය තුළ දේව භක්තිය අතිවීමට පෙර අන්ධකාරය පලායන පිණිස යම් අය ඒ උදෙසා යාච්ඤා කළ යුතුය. ස්වාමීවූ යේසුස් වහන්සේගේ නාමයෙන් සතුරාගෙන් ජයගන්නා පිණිස උන්වන්සේගේ මහත් වූ ඉලය අප ඉදිරියේ තබන සේක.

අපි ක්‍රිස්තුස් වහ්නසේ සමඟ කල්වාරියේ සිටීමින් උන්වහන්සේගේ ජයග්‍රහණය ප්‍රකාශ කරන්නෙමු. එහිදී අපට අන්ධකාරයේ සේනාව බලායන ආකාරය දැකිය හැකිය. යාච්ඤා කතිරීමේ දී අපට මහත් නිදහසක් ඇත. වැඩියෙන් ඉල්ලා සිටීමට ඇදහිල්ල ඇත. එහිදී අප ඉදිරියට ගොස් ඇත්තේ ජයග්‍රහණය දැනටමත් අපේ බවත්, කොල්ලය අපි බලා සිටින බවත් සොයා ගැනීමට වන්නේය.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මූලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:

පෙරමග දූතයා

30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.